# I. 1970 ආර්ථික හැඩගැස්ම, ගැටළු සහ ප්‍රතිපත්ති

## (අ) ආර්ථික හැඩගැස්ම

### 1. ජාතික නිෂ්පාදිතය

1970 වසරේදී දළ ජාතික නිෂ්පාදිතය ස්ථාවර මිල අනුව රුපියල් දශලක්ෂ 9,316 සිට රුපියල් දශලක්ෂ 9,695 දක්වා ඉහළ ගියේය. මෙය සියයට 4·1 ක වර්ධනයක් පිළිබිඹු කරන අතර, කලින් වසරේ මෙම වර්ධනය සියයට 5·1 ක් විය. මෙය දශකයේ (1960 - 69) සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය වන සියයට 4·5 ට වඩා පහත් එකක් වුවද, 1960 - 67 කාලසීමාවේ සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය වූ සියයට 3·9 ට වඩා යහපත්ය. දශකයේ සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය උසස් මට්ටමක පැවතීමට හේතු වූයේ 1968 වර්ධන වේගය ඉහළ මට්ටමක පැවතීමයි. 1970 වසරේ ජනගහනය වර්ධනය වූ සියයට 2·1 ට ඉඩහල විට, ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතයෙහි වර්ධනය සියයට 2·0 ක් විය. 1969 දී රුපියල් 760 ක් වූ ඒකපුද්ගල නිමැවුම 1970 දී රුපියල් 775 දක්වා ඉහළ ගියේය.

පසුගිය වසරට වඩා අඩුවෙන් පැවතුන දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය විග්‍රහ කළයුත්තේ, වසරේ මැද භාගයේ සිට රජය මගින් හඳුන්වා දෙන ලද නව ආර්ථික ප්‍රතිපත්ති, විශේෂයෙන්ම ආනයන සහ පෞද්ගලික අංශයේ කර්මාන්ත වඩා යෝග්‍ය පදනමකට ගෙන ඒම පිළිබඳ ප්‍රතිපත්තිවලට අනුකූල වන සේ අර්ථ ක්‍රමයේ ඇති වූ පොදු ප්‍රති සංවිධානය සැලකිල්ලට ගැනීමෙනි. මෙම ප්‍රතිපත්ති, ක්‍රියාකාරිත්ව පරිමාව කෙරෙහි කිසියම් ප්‍රමාණයකට බල පෑ අතර, එම නිසා 1970 වසරේ වර්ධනය 1968 සහ 1969 වර්ෂ සඳහා වූ එම අනුපාතයන් හා සැසඳීම එතරම් ගැලපෙන සුළු නොවිය හැකිය. කලින් වසර දෙකෙහි ඇති වූ ප්‍රසාරණය, ප්‍රවාහණය, පණිවුඩ හුවමාරුව සහ තැනීම් කටයුතු සහ ප්‍රධාන වශයෙන් කර්මාන්ත සඳහා අවශ්‍ය ද්‍රව්‍ය රාශියක් ලබා ගැනීමේ හැකියාව මත රඳා පැවතුනි. විවෘත පොදු බලපත්‍ර ක්‍රමය අත්හිටු වීම හේතුකොට ගෙන ද්‍රව්‍ය රාශියක ලබා ගැනීමේ හැකියාව සෑහෙන ප්‍රමාණයකට සීමා වෙමින් පවතී. කලින් කාලසීමාවන්හිදී රැස් කර ගන්නා ලද තොග උපකාර කොට ගැනීමෙන්, වසරේ කිසියම් කාල සීමාවක් දක්වා 1968 සහ 1969 පැවති මට්ටම්වලම ව්‍යාපාරික කටයුතු පවත්වා ගත හැකි වුවද, ක්‍රමයෙන් එම තොග අඩු වී ගිය අතර, වර්ෂයේ හතරවන කාර්තුව වන විට ප්‍රතිසම්පාදනය අත්‍යාවශ්‍යව පැවතුනි.

**I-1 සංඛ්‍යා සටහන**

**1970 දළ දේශීය නිෂ්පාදිතය - අංශ අනුව වර්ධනය (ස්ථාවර මිල අනුව)**

| | 1969 රුපි· දශ ලක්ෂ | 1970 රුපි· දශලක්ෂ | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| 1· කෘෂිකර්මය, දව කර්මාන්තය, දඩයම සහ ධීවර කර්මාන්තය | 3,276·4 | 3,395·2 | 3·6 |
| 2· පතල් කැනීම සහ ගල් කැඩීම .. | 55·0 | 65·2 | 18·5 |
| 3· නිමැවුම් කර්මාන්තය .. | 1,260·5 | 1,334·9 | 5·9 |
| 4· තැනීම් කටයුතු .. | 519·5 | 598·2 | 15·1 |
| 5· විදුලි බලය, ගෑස්, ජලය සහ සෞඛ්‍ය සේවාවන් .. | 17·6 | 21·3 | 21·0 |
| 6· ප්‍රවාහනය, ගුදම් කිරීම සහ පණිවුඩ හුවමාරුව .. | 899·1 | 912·5 | 1·5 |
| 7· තොග සහ සිල්ලර වෙළඳාම .. | 1,366·7 | 1,391·4 | 1·8 |
| 8· බැංකු, රක්ෂණ කටයුතු සහ නිශ්චල දේපල .. | 113·7 | 118·0 | 3·8 |
| 9· නිවාස අයිතිය .. | 290·9 | 301·5 | 3·6 |
| 10· රාජ්‍ය පරිපාලනය සහ ආරක්ෂාව .. | 445·4 | 458·8 | 3·0 |
| 11· සේවා .. | 1,138·9 | 1,183·7 | 3·9 |

අංශ අනුව දළ දේශීය නිෂ්පාදිතයෙහි වර්ධනය, ස්ථාවර මිල අනුව I-1 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. පතල් කර්මාන්තය සහ ගල් කැඩීම, තැනීම් කටයුතු සහ විදුලි බලය හා ගෑස්, වර්ෂය තුළදී බෙහෙවින් සතුටුදායක වර්ධනයක් පිළිබිඹු කළ අංශයන් විය. මෙම

එකිනෙක අංශයන් සම්බන්ධයෙන් 1970 වසරේ ඇති වූ ප්‍රසාරණය සියයට 15 ඉක්ම වූ අතර, ප්‍රවාහනය සහ තොග සහ සිල්ලර වෙළඳාම හැරුනු විට අනෙක් සියලු අංශ සඳහා වූ ප්‍රසාරණය සියයට 3 කට වඩා වැඩි විය. කිසිදු අංශයක් පැහැදිළි වශයෙන් පහල යාමක් පිළිබිඹු කොට නැත.

කෘෂිකර්මය පිළිබඳව සලකන විට, වී නිෂ්පාදනය සියයට 16·5 කින්, එනම් බුසල් දශලක්ෂ 76·8 දක්වා ඉහළ ගිය අතර, 1969 දී සියයට 0·9 ක් වූ මෙම අංශයේ වර්ධනය 1970 දී සියයට 3·6 දක්වා ඉහළ නැගුනි. එය තරමක් දුරට තේ නිෂ්පාදනය පහල යාමෙන් ඇති වූ බලපෑම මගහරවාලීමට උපකාරී විය. තේ නිෂ්පාදනය තරමක් තියුණු ලෙස පහල යාමේ උපනතියක් පිළිබිඹු කොට ඇත. 1970 දී රාත්තල් දශලක්ෂ 468 ක් වූ එය 1962 නිෂ්පාදනයට පමණක් මඳ වශයෙන් ඉහළින් පැවතුනි. ගෙඩි දශලක්ෂ 2,447 ක් වූ පොල් නිෂ්පාදනය 1969 පැවති නිෂ්පාදනය ඉක්මවා ගොස් තිබුනද, 1966 දී පවත්වාගත් නිෂ්පාදන මට්ටමට වඩා පහත් විය. රබර් නිෂ්පාදනය, රාත්තල් දශලක්ෂ 333 සිට රාත්තල් දශලක්ෂ 351 දක්වා ඉහල ගියේය. තේ සහ පොල් යන නිෂ්පාදන දෙකම ඉතා වැදගත් විදේශීය විනිමය ඉපයුම් මාර්ගයන් වන හෙයින්, මෙම කර්මාන්ත දෙකෙහිම නිෂ්පාදනය නංවාලීම සඳහා අඛණ්ඩ උත්සාහයක් දැරීම අවශ්‍ය වනු ඇත.

1969 දී රුපියල් දශලක්ෂ 1,748 ක් වූ පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය සංස්ථාවන්හි දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය 1970 දී රුපියල් දශලක්ෂ 1,707 දක්වා පහත වැටුනි. ආයෝජනය පහල යාමට මූලික හේතුව වූයේ, ආයෝජන සහ අන්තර් භාණ්ඩ ආනයනය පහල යාමය. 1970 දී රාජ්‍ය අංශයේ ආයෝජනය රුපියල් දශලක්ෂ 505 සිට රුපියල් දශලක්ෂ 785 දක්වා ඉහල ගියේය. රජය සතුව පැවති සහල් තොග විශාල වශයෙන් ඉහල යාම මෙම වර්ධනයෙන් පිළිබිඹු වෙයි. 1969 දී සියයට 18·6 ක් වූ දළ දේශීය වියදමෙහි ඇතුලත් මූලධන සම්පාදන ප්‍රමාණය 1970 දී සියයට 19·0 දක්වා ඉහල ගියේය. දළ දේශීය වියදම රුපියල් දශලක්ෂ 453 කින් දළ ජාතික නිෂ්පාදිතය ඉක්ම වූ අතර, සංචිත උපයෝගී කොට ගැනීම සහ විදේශාධාර මගින් හිඟය පියවා ගන්නා ලදී.

## 2. රාජ්‍ය අයවැය සහ මූල්‍ය කටයුතු හැඩගැස්ම

### 1. රාජ්‍ය මුදල් පරිහරණය

1969/70 දී, තාවකාලික සංඛ්‍යා දත්තයන් අනුව පෙනී යන පරිදි, රජයේ අයභාර එකතුව රුපියල් දශලක්ෂ 2,736 ක්වූ අතර ශුද්ධ වියදම් රුපියල් දශලක්ෂ 3,672 ක වාර්තාගත මට්ටමකට ඉහළ නැගීමෙන්, රුපියල් දශලක්ෂ 936 ක්වූ ශුද්ධ මුදල් හිඟයක් හටගති. 1969/70 දී ඇතිවූ මුදල් හිඟය මෙතෙක් ඇතිවූ ඉහළම හිඟයවූ අතර, එය විදේශීය අංශයෙන් රුපියල් දශලක්ෂ 220 ක් ලබා ගැනීමෙන්ද, බැංකු නොවන දේශීය අංශයෙන් රුපියල් දශලක්ෂ 288 ක් සහ බැංකු ක්‍රමයෙන් රුපියල් දශලක්ෂ 454 ක් ණයට ගැනීමෙන්ද පියවා ගන්නා ලදී. කෙසේ නමුත්, මෙසේ සංචලතාවයටපත් සම්පත්, අවශ්‍යතාවයන් ඉක්මවූ අතර, මුදල් ශේෂයන්හි රුපියල් දශලක්ෂ 26 ක ඉහළ යාමක් ජනිත කළේය. රාජ්‍ය මුදල් පරිහරණ කටයුතුවලින් 1969/70 දී හටගත් ශුද්ධ ප්‍රසාරණය රුපියල් දශලක්ෂ 428 ක් බවට ඇස්තමේන්තු කෙරිණ. (1969/70 මුදල් වර්ෂය ආරම්භයේදී ගෙවීමට ඉතිරිව තිබූ රුපියල් දශලක්ෂ 92 ක්වූ රජයේ ආහාර ආනයන වියදම් පියවීමට ගැලපීම් කළ පසු එය රුපියල් දශලක්ෂ 336 කි.) කිසියම් එක් වර්ෂයකදී රාජ්‍ය අයවැය කටයුතු හේතුවෙන් හටගත් අධිකතම මූල්‍ය ප්‍රසාරණය 1969/70 වර්ෂය සඳහා විය.

1969/70 දී රජයේ අයභාරය රුපියල් දශ ලක්ෂ 239කින් ඉහළ ගියේය. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මත ව්‍යාපාරික පිරිවැටුම් බද්ද පැනවීමත්, පිරිවැටුම් බද්දෙන් බැහැර කර තිබූ සිගරට් යලිත් එයට ඇතුළත් කිරීමත්, නිෂ්පාදන කර්මාන්ත සම්බන්ධයෙන් පිරිවැටුම් බද්දෙහි යම් යම් ප්‍රතිශෝධනයන් කිරීමත්, මේ මාර්ගයෙන් ලද අයභාරයෙහි රුපියල් දශලක්ෂ 136 ක වැඩිවීමට හේතු සැලසීය. විවිධිස

අයභාරය රුපියල් දශලක්ෂ 161 කින් තියුණු ලෙස ඉහළ යාමට මූලික හේතුව වූයේ රජයේ දෙපාර්තමේන්තුවල බොහොමයක් ආනයන විවිහිස ක්‍රමය යටතට පත් කිරීමට ගත් තීරණය නිසාය; මෙය, විවෘත පොදු බලපත්‍ර ක්‍රමය 1970 මැයි මාසයේදී අත්හිටුවීමෙන් පසු විවිහිස මගින් ලද අයභාරයේ පහළයාම පමණටත් වඩා කපා හැරීමට සමත් විය. ආදයම් බදුවලින් ලද, රුපියල් දශලක්ෂ 98 කින් වැඩිවූ ලැබීම්වලට යම් තරමකට තුඩු දුන් සාධකයක් වූයේ, සංස්ථා සහ පෞද්ගලික ව්‍යාපාර ආයතනවලින් බදු අත්තිකාරම් එකතු කිරීමය. 1969/70 අයවැය ලේඛනයෙන් රලු සහ අමු තෙල් වලින් ගන්නා ආනයන ගාස්තු ඉවත් කිරීම, ආනයන ගාස්තු රුපියල් දශලක්ෂ 154 කින් අඩුවීමට ප්‍රධාන හේතුව විය. රජයේ විදුලිබල සැපයීම් යටතේ ලද අයභාරය නැතිවීමට හේතුව, එය වෙනම සංස්ථාවක් ලෙස ප්‍රති නිර්මාණය කිරීමත් ඒ අනුව එහි ආදයම් රජයේ ගිණුම්වලින් ඉවත් කිරීමත්ය.

1969/70 දී, රජයේ මුළු ශුද්ධ වියදම්, සියයට 12 කින් හෙවත් රුපියල් දශලක්ෂ 387 කින් ඉහළ ගියේය. ඉන් රුපියල් දශලක්ෂ 275 ක් නැතිනම් සියයට 12 ක් ප්‍රතිවර්තන වියදම් සඳහා වෙන්වූ අතර, ප්‍රාග්ධන කටයුතු සඳහා වෙන්වූ වියදම් සියයට 5 කින් හෙවත් රුපියල් දශලක්ෂ 40 කින් අඩුවීමෙන්ද, අත්තිකාරම් ගිණුම් ගෙවීම් රුපියල් දශලක්ෂ 152 කින් වැඩිවීමෙන්ද සමන්විත විය. ආර්ථික සහ කාර්යමය පදනමක් යටතේ, වර්තන වියදම් සියයට 9 කින් හෙවත් රුපියල් දශලක්ෂ 238 කින් ඉහළ යාමක් පිළිබිඹු වන අතර, ප්‍රාග්ධන වියදම් සියයට 3 කින් හෙවත් රුපියල් දශලක්ෂ 27 කින් පහළ බැස ඇත.

රජයේ දෙපාර්තමේන්තුවල ආනයන බොහොමයක් විවිහිස ක්‍රමය යටතට ගැනීමේ තීරණය සහ රජයේ සේවකයින්ගේ වැටුප් වැඩිවීම හේතුකොටගෙන, වර්තන වියදම් වැඩිවිය. අනෙක් අතට, රජයේ විදුලිබල සැපයීම් දෙපාර්තමේන්තුව ප්‍රති නිර්මාණය කිරීම, වෙළඳ ව්‍යාපාරවල දළ ගෙවීම් සැහෙන ප්‍රමාණයකින් අඩු කිරීමට හේතු විය.

සංක්‍රාම ගෙවීම්, ප්‍රධාන වශයෙන් දළ ආහාර සහනාධාර සහ රාජ්‍ය ණය සඳහා පොළී ගෙවීම් සහ විශ්‍රාම වැටුප්වලින් සමන්විත විය. සංක්‍රාම ගෙවීම් හා අධ්‍යාපන, සෞඛ්‍ය, යනාදී සුභසාධක වැඩ කටයුතු 1969/70 දී පිළිවෙලින් සියයට 7 සහ සියයට 14 බැගින් වර්ධනය වීමක් දක්නට ලැබුණේ, 1970 දී ජනගහනය සියයට 2·1 කින්ද, දළ ජාතික නිෂ්පාදිතය සියයට 4·1 කින්ද වැඩිවීම සමගය. 1968/69 දී සියයට 16 කින්ද, 1967/68 සහ 1969/70 දී සියයට 10 බැගින්ද අයභාරය ඉහළ යන විට වර්තන වියදම් සම්බන්ධිත ඉහල යාම වූයේ, 1967/68 දී සියයට 14 ක් සහ 1968/69 හා 1969/70 දී සියයට 9 බැගිනි.

රජයේ ප්‍රාග්ධන වියදම්, 1969/70 දී රුපියල් දශලක්ෂ 883 ක්වූ අතර එය කලින් වසරේ පැවති රුපියල් දශලක්ෂ 910 ට වඩා අඩු මට්ටමකි. මෙයට තුඩු දුන්නේ, 1969 නොවැම්බර-යේදී රජයේ විදුලිබල සැපයීම් දෙපාර්තමේන්තුව පොදු සංස්ථාවක් ලෙස ප්‍රති නිර්මාණය කිරීම නිසා, එහි ප්‍රාග්ධන වියදම් රජයේ ගිණුම් වලින් ඉවත් කිරීමය.

1969/70 සඳහා අයවැයෙහි, රුපියල් දශලක්ෂ 722 ක ශුද්ධ මුදල් හිඟයක් බලාපොරොත්තු වූ නමුත්, තාවකාලික සංඛ්‍යා අනුව එය රුපියල් දශලක්ෂ 936 ක්වූ බව පෙනී යයි. ශුද්ධ මුදල් හිඟය වැඩිවීමට බොහෝ දුරට හේතු වූයේ, අපේක්ෂිත ආදයමේ අඩුවීම වන අතර එය අයවැයෙන් විධිවිධාන යොදා නොතිබූ අන්දමේ වියදම්, හෙවත් අත්තිකාරම් ගිණුම් යටතේ රුපියල් දශලක්ෂ 201 ක ගෙවීමක් සහ ප්‍රතිවර්තන හා ප්‍රාග්ධන කටයුතු සඳහා අඩු වියදමක් දැරීමට සිදුවීමෙන් තරමක් දුරට මැකී ගියේය. සම්පත් පිළිබඳ ප්‍රශ්නයට මුහුණ පෑමේදී රජයට තවත් දුෂ්කරතාවක් වූයේ, විදේශීය මාර්ගවලින් බලාපොරොත්තුවූ ණය ගැනීම් රුපියල් දශලක්ෂ 142 කින්ද, බැංකු-නොවන අංශයෙන් අපේක්ෂිත ණය රුපියල් දශලක්ෂ 15 කින්ද අඩුවීමයි. මේ නිසා රජයට රුපියල් දශලක්ෂ 454 ක්වූ ණය ප්‍රමාණයක් බැංකුවලින් ලබා ගැනීමට සිදුවිය.

## I-2 සංඛ්‍යා සටහන

## 1969/70 දී ශුද්ධ මුදල් හිඟය පියවූ අන්දම

(රුපියල් දශ ලක්ෂ)

| මාර්ගය | මූලික සංඛ්‍යා (අපේක්ෂිත) | නියම සංඛ්‍යා (තාවකාලික) | හිඟය (–) හෝ අධිකය (+) |
|---|---|---|---|
| 1. විදේශ මුදල් ලැබීම් (ද්‍රව්‍ය හා යෝජනාක්‍රම ආධාර) .. | 362 | 220 | – 142 |
| 2. දේශීය ණය | | | |
| (අ) බැංකු නොවන මාර්ගවලින් ගත් වෙළෙඳ පොළ ණය | 281 | 266 | – 15 |
| (ආ) වෙළෙඳපොළ නොවන ණය .. | — | 22 | + 22 |
| 3. එකතුව (1+2) .. .. | 643 | 508 | – 135 |
| 4. ශුද්ධ මුදල් හිඟය .. .. | 722 | 936 | + 214 |
| 5. ශුද්ධ ප්‍රසාරණාත්මක මුදල් සැපයීම (4–3) .. | 80 | 428 | 348 |

1965/66 සිට 1969/70 දක්වා මුදල් වර්ෂ සඳහා ශුද්ධ මුදල් හිඟයනට මුදල් සැපයුන අන්දම, එබඳු මුදල් සැපයීම්වල ඇස්තමේන්තුගත ප්‍රසාරණාත්මක බලපෑම සමග 1–3 සටහනෙන් ඉදිරිපත්කොට ඇත.

## I-3 සංඛ්‍යා සටහන

## 1965/66 සිට 1969/70 දක්වා ශුද්ධ මුදල් හිඟයට මුදල් සැපයුන මාර්ග

(රුපියල් දශලක්ෂ)

| මාර්ගය | 1965/66 | 1966/67 | 1967/68 | 1968/69 | 1969/70 (තාවකාලික) |
|---|---|---|---|---|---|
| 1. බැංකු නොවන මාර්ගවලින් ලද මුළු මුදල් .. | 486·1 | 577·9 | 448·3 | 608·3 | 508·0 |
| (අ) දේශීය බැංකු නොවන ණය .. | 112·2 | 72·3 | 9·8 | 52·2 | 21·8 |
| (ආ) බැංකු නොවන මාර්ග වලින් ලද දේශීය වෙළෙඳපොළ ණය .. .. | 255·9 | 297·0 | 248·3 | 202·5 | 266·0 |
| (ඇ) විදේශීය ණය හා පරිත්‍යාග .. .. | 118·0 | 208·6 | 190·2 | 353·6 | 220·2 |
| 2. බැංකු ක්‍රමයෙන් ලද දේශීය ණය .. | 162·3 | 51·3 | 303·5 | 68·1 | 453·5 |
| 3. රජයේ මුදල් ශේෂ සහ ද්‍රව්‍යාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ප්‍රයෝජනයට ගැනීම් .. | – 82·4 | – 22·4 | – 36·1 | 111·2 | – 25·6 |
| (අ) මුදල් ශේෂ .. .. | – 47·2 | 21·5 | – 48·4 | 62·9 | – 30·6 |
| (ආ) විදේශාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් .. | – 35·2 | – 43·9 | 12·3 | 48·3 | 5·0 |
| 4. මුළු ශුද්ධ මුදල් ශේෂය .. | 566·0 | 606·8 | 715·7 | 787·5 | 935·6 |
| 5. එක්සත් ජනපද ආධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් සඳහා ගැලපීම් .. | 42·5 | 27·2 | — | – 0·3 | .... |
| 6. රාජ්‍ය මූල්‍ය කටයුතුවල ශුද්ධ ප්‍රසාරණාත්මක බලපෑම (2+3+5) .. | 122·4 | 56·1 | 267·4 | 179·0 | 427·9 |

විදේශීය අංශයෙන් හිඟය පියවීම සඳහා රුපියල් දශලක්ෂ 220 ලබා ගැනීමේදී රුපියල් දශලක්ෂ 183 ක් ද්‍රව්‍යාධාර ණය සහ රුපියල් දශලක්ෂ 57 ක් පරිත්‍යාග වශයෙන්වූ අතර, යෝජනා ක්‍රම ණය යටතේ රුපියල් දශලක්ෂ 19 ක ශුද්ධ ආපසු ගෙවීම් නිසා ඉන් කොටසක් කැපී ගියේය. යෝජනා ක්‍රම ණයවල ශුද්ධ ආපසු ගෙවීම් ඉහළ යාමෙන් පෙනීයන්නේ මෙතෙක් රජයේ සම්පත් ප්‍රශ්ණය සෑහෙන පමණ ලිහිල් කිරීමට තුඩු දුන් විදේශ ණය ගැනීම රජයේ අයවැය පිළිබඳව සෑහෙන බරක් පැටවීමට හේතු වෙමින් පවතින බවයි. 1969/70 දී ද්‍රව්‍ය ණය ලෙස ලබාගත් සම්පත් ප්‍රමාණය ඊට පෙර වසරට වඩා සෑහෙන පමණ අඩුවන අතර පරිත්‍යාග ස්වරූපයෙන්වූ ලැබීම් රුපියල් දශලක්ෂ 57 ක් විය. 1969/70 දී ශුද්ධ මුදල් හිඟයෙන් සියයට 23 ක් විදේශීය සහායෙන් පියවාගත් අතර, 1968/69 දී එය සියයට 45 ක් විය.

1970/71 සඳහා වන අයවැය ලේඛනය රුපියල් දශලක්ෂ 2,878 ක මුළු අයභාරයක් බලාපොරොත්තු වන අතර, රුපියල් දශලක්ෂ 3,809 ක මුළු ශුද්ධ වියදමකට ඉඩ සලසයි. රුපියල් දශලක්ෂ 931 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති ශුද්ධ මුදල් හිඟයෙන්, රුපියල් දශලක්ෂ 440 ක් දේශීය ණය ගැනීම්වලින්ද, රුපියල් දශලක්ෂ 491 ක් විදේශීය මුදලින්ද සැපයීමට නියමිතය. අයවැය කටයුතුවල ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් දශලක්ෂ 97 ක් ලෙස ඇස්තමේන්තු කෙරී ඇත.

### (ආ) මුදල් හා ණය

1970 වර්ෂයේදී මුදල් සැපයුම සැලකිය යුතු ප්‍රමාණයකින්, එනම් රුපියල් දශලක්ෂ 83 කින් වැඩිවිය. එහි මාසික සාමාන්‍ය, ඉකුත් වර්ෂයේදී පැවති මට්ටමට වඩා සියයට 4 කින් ඉහළය. වසරේ මුල් මාස දහය තුළදී, මුදල් සැපයුම වැඩිවීමේ වේගය මෙයින් නොපෙනේ. ඒ කාලය තුළදී එය සියයට 9·8 කින් වැඩිවිය. 1970 ඔක්තෝබර් මාසයේදී ප්‍රධාන වශයෙන්ම විමුල්‍යනය නිසා මූල්‍ය ප්‍රසාරණය නැවතුනා පමණක් නොව, එහි උපනතියෙහි ආපසු හැරීමක්ද ඇතිවිය. නොවැම්බර් මාසයේදී, මුදල් සැපයුමෙහි අඩුවීම රුපියල් දශලක්ෂ 140 කි. විමුල්‍යනය මගින් ඇති කළ සංකෝචනය, දෙසැම්බර් මාසයේදී, මුදල් සැපයුම යළිත් රුපියල් දශලක්ෂ 39 කින් හෙවත් සියයට 2·1 කින් වැඩිවූ විට නැවත තරමක් ආපසු හැරුණි.

### I – 4 සංඛ්‍යා සටහන

### මුදල් සැපයුමෙහි වෙනස – 1969 දෙසැම්බර් අග සිට 1970 දෙසැම්බර් අග දක්වා

(රුපියල් දශ ලක්ෂ)

| මුදල් සැපයුම කෙරෙහි බලපාන සාධක | ප්‍රමාණය | |
|---|---|---|
| 1· ප්‍රසාරණාත්මක සාධක | | |
| (අ) පෞද්ගලික අංශයට* දුන් වෙළඳ බැංකු ණය .. | 104·3 | |
| (ආ) රාජ්‍ය සංස්ථාවන්ට දුන් වෙළඳ බැංකු ණය .. | 43·2 | |
| (ඇ) බැංකු ක්‍රමයෙන් රජයට දුන් ණය .. | 349·8 | |
| (ඈ) රජයේ සමායතනයන් සතු කාලීන හා ඉතුරුම් තැන්පතු අඩුවීම .. | 17·5 | |
| (ඉ) වෙළඳ බැංකුවල අනෙකුත් වගකීම් හා ගිණුම් (ශුද්ධ) අඩුවීම .. | 12·4 | 527·2 |
| 2· සංකෝචනාත්මක සාධක | | |
| (අ) බැංකු විදේශීය වත්කම් අඩුවීම .. | 1·5 | |
| (ආ) පෞද්ගලික අංශයේ* කාලීන හා ඉතුරුම් තැන්පතු වැඩිවීම .. | 196·3 | |
| (ඇ) මහ බැංකුවේ අනෙකුත් වගකීම් හා ගිණුම් (ශුද්ධ) වැඩිවීම .. | 120·4 | |
| (ඈ) රජයේ මුදල් ශේෂයන් වැඩිවීම .. | 124·2 | |
| (ඉ) ගැලපීම් .. | 1·1 | 443·5 |
| 3· මුදල් සැපයුමෙහි වෙනස | | + 83·5 |

* සමුපකාර ද ඇතුළත් වේ.

මෙම වසරේදී, ප්‍රධාන වශයෙන් රජයේ මූල්‍ය කටයුතු, මූල්‍ය ප්‍රසාරණයට හේතුවූ අතර පෞද්ගලික අංශයේ සමස්ත බලපෑම් සංකෝචනාත්මක විය. රාජ්‍ය අංශය තුළින් ඇතිවූ ශුද්ධ ප්‍රසාරණය රුපියල් දශලක්ෂ 105 කි. බැංකු ක්‍රමය වෙතවූ රජයේ ණයගැතිභාවය රුපියල් දශලක්ෂ 349 කින් වැඩිවිය. මහ බැංකුවේ රාජ්‍ය පත්‍ර දැරීම් සහ අත්තිකාරම් රුපියල් දශලක්ෂ 155 කින් ඉහළ ගියේය. මේවා මූලික වශයෙන් ප්‍රයෝජනයට ගනු ලැබුයේ, සහතික මිළ ක්‍රමය යටතේ වී මිළදී ගැනීම සඳහාවූ බඩු තොග කුවිතාන්සි අත්තිකාරම් පියවීම සඳහාය. රජයට දුන් වෙළඳ බැංකු ණය රුපියල් දශලක්ෂ 194 කින් වැඩිවිය. භාණ්ඩාගාර බිල්පත් සහ, රජයේ හා රජය මගින් සහතික කළ සුරැකුම් පත් වැඩිවීම්වලින් එය සමන්විත විය. එහෙත් මෙම වැඩිවිම, රජයේ මුදල් ශේෂයන් රුපියල් දශලක්ෂ 124 කින් හා අනෙකුත් වගකීම් හා මහ බැංකුවේ ගිණුම් රුපියල් දශලක්ෂ 120 කින් වැඩිවීම නිසා අඩ වශයෙන් සමහන් විය.

මෑත වසරවලදී පැවති උපනතීන්ට වෙනස්ව යමින් මෙම වර්ෂයේදී, මූල්‍ය ප්‍රසාරණය අඩු කිරීමෙහිලා විදේශ ගෙවුම් හිඟයෙන් සුළු බලපෑමක් ඇති විය. 1969 වර්ෂයේදී බැංකු විදේශීය වත්කම් අඩුවීම රුපියල් දශලක්ෂ 299 ක්වූ අතර, 1970 වර්ෂයේදී මෙකී වත්කම් අඩුවීම නිසා මුදල් සැපයුම කෙරෙහිවූ බලපෑම රුපියල් දශලක්ෂ 1 ක් පමණි.

## I – 5 සංඛ්‍යා සටහන

### රජයට සහ පෞද්ගලික අංශයට දුන් ණය
### (වාර්ෂික වෙනස්වීම් රුපියල් දශ ලක්ෂ වලින් දක්වා ඇත)

| | 1968 | 1969 | 1970 |
|---|---|---|---|
| රජය .. .. .. | + 192·0 | + 117·4 | + 349·8 |
| මහ බැංකුවෙන් | | | |
| 1· ණය සහ අත්තිකාරම් .. .. | + 37·5 | − 7·6 | + 29·5 |
| 2· රජයේ සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් .. | + 269·4 | + 112·0 | + 126·2 |
| අනු කොටස් එකතුව .. .. | + 306·9 | + 104·4 | + 155·7 |
| වෙළඳ බැංකු වලින් | | | |
| 1· ආනයන බිල්පත් .. .. .. | − 125·0 | + 87·9 | − 141·8 |
| 2· රජයේ සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් .. | + 10·1 | − 83·1 | + 334·9 |
| 3· වෙනත් .. .. | — | + 8·2 | + 0·7 |
| අනු කොටස් එකතුව .. .. | − 114·9 | + 13·0 | + 194·1 |
| පෞද්ගලික අංශය | | | |
| වෙළඳ බැංකු වලින් | | | |
| 1· රාජ්‍ය සංස්ථාවන් .. .. | + 90·6 | + 69·9 | + 43·2 |
| 2· පෞද්ගලික අංශයේ අනෙකුත් කොටස් .. .. | + 173·5 | + 156·2 | + 104·3 |
| 3· අපනයන බිල්පත් .. .. .. | + 26·8 | + 5·7 | + 20·6 |
| අනු කොටස් එකතුව .. .. | + 290·9 | + 231·8 | + 168·1 |
| 4· වෙළඳ බැංකු වෙත වූ පෞද්ගලික සුරැකුම්පත් සඳහා ගැලපීම් .. .. | — | + 2·4 | + 0·4 |
| අනු කොටස් එකතුව .. .. | + 290·9 | + 229·3 | + 167·8 |
| බැංකු ක්‍රමයෙන් දෙන ලද මුළු ණය ප්‍රමාණය .. | + 482·9 | + 346·7 | + 517·6 |

1970 වර්ෂයේදී රාජ්‍ය සංස්ථාවන් ඇතුළු පෞද්ගලික අංශයට දෙන ලද බැංකු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 147 කින් ඉහළ ගියේය. ඉකුත් වර්ෂයේදී රුපියල් දශලක්ෂ 226 ක වැඩිවීමක් හා සසඳන කල මෙහි සැලකියයුතු අඩුවීමක් පෙනේ. සහතික මිළ ක්‍රමය යටතේ, රජයට වී විකිණීම සඳහා බඩු තොග කුවිතාන්සි යටතේ සමුපකාර ආයතන-යන්ට දෙන ලද ණය සහ කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ දෙන ලද ණය පහසුකම්ද, එකී වැඩිවීම්වලට මූලික වශයෙන් හේතු විය. පෞද්ගලික අංශයට දෙන ලද ණය තුලින් ඇතිවූ ප්‍රසාරණය, කාලීන හා ඉතුරුම් තැන්පතු රුපියල් දශලක්ෂ 178 කින් වැඩිවීම නිසා, ප්‍රමාණයටත් වඩා සමහන් විය. මෙම වැඩිවීමෙන් විශාල කොටසක් විමූල්‍යනය නිසා ඇති-වුණි.

මුල් මාස නවය තුළදී, වෙළඳ බැංකු සම්පත් සඳහා, ප්‍රධාන වශයෙන්ම රජය වෙතින් අධික ඉල්ලුමක් පැවතිණි. මෙම ඉල්ලුම මහ බැංකුවෙන් ගත් ණය ප්‍රමාණයෙහි වැඩිවීමකින් පියවන ලදී. විමූල්‍යනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් වෙළඳ බැංකු ද්‍රවශීලතා තත්ත්වයෙහි සැලකිය යුතු දියුණුවක් ඇතිවීමත් සමගම, මහ බැංකුව වෙතවූ ඒවායේ ණයගැතිභාවය, දෙසැම්බර් අවසානය වන විට රුපියල් දශලක්ෂ 148 දක්වා අඩු කරගත හැකි විය.

මේ අනුව බලන විට, වෙළඳ බැංකු ද්‍රවශීලතා තත්ත්වය වර්ෂයේ අවසාන තුන් මාසය තුළදී ප්‍රමාණයටත් වඩා සතුටුදයකවූ නමුදු මුල් මාස නවය තුළදී එහි සැලකිය යුතු මිරිකීමක් ඇතිවූ බව පෙනේ. මෙම කාලච්ඡේදය තුළදී ණය සහ අයිරාවන්හි මාසික සාමාන්‍ය මට්ටම, මුළු තැන්පතු වලින් සියයට 71·4 ක් විය. ඉකුත් වර්ෂයේදී එය සියයට 66·6 ක් විය. 1969 වර්ෂයේදී, සියයට 14·8 ක්වූ මුළු තැන්පතුවල මාසික සාමාන්‍ය ආයෝජන මට්ටම 1970 වර්ෂයේ මුල් මාස නවය තුළදී සියයට 13·5 දක්වා අඩුකරලීමට වෙළඳ බැංකුවලට සිදුවිය. අවසාන තුන් මාසයේදී, ද්‍රවශීලතා තත්ත්වය දියුණුවීමත් සමග, එම අනුපාතය, දෙසැම්බර් අවසානය වන විට සියයට 15·1 දක්වා වැඩිවිය. 1970 දෙසැම්බර් අවසානයේදී, ණය සහ අයිරා, මුළු තැන්පතුවල අනුපාතයක් වශයෙන් සියයට 58·6 දක්වා අඩුවිය.

ණය ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් සැලකිය යුතු වෙනසක් කරන ලද්දේ, 1970 ජනවාරි මාසයේදී, මහ බැංකු පොළී අනුපාතය සියයට 5½ සිට 6½ දක්වා වැඩි කිරීමයි. වෙළඳ බැංකු ණය සම්බන්ධයෙන්, 1969 ජුලි මාසයේදී ක්‍රියාත්මකව පැවති සංශෝධිත ණය සීමාවන් මහ බැංකුව මගින් තවදුරටත් පවත්වාගෙන යයි.

## (ඇ) විමුද්‍රායනය

1970 ඔක්තෝබර් 25 වැනිද කියැ වූ 1970/71 අය වැය කථාවේදී, ගරු මුදල් ඇමති තුමා විසින්, දැනට පවතින රුපියල් 100 හා රුපියල් 50 වටිනාකමින් යුත් නෝට්ටු 1970 නොවැම්බර් 3 වැනිද සිට නීත්‍යානුකූල නොවන බව ප්‍රකාශයට පත් කරන ලදී. මෙම පාලනයෙහි අරමුණ වූයේ රටේ රාශීකරණය කර ඇතැයි විශ්වාස කළ සැහෙන නෝට්ටු ප්‍රමාණයක් එළියට ගැනීමයි. මෙම ප්‍රති රාශිකරණ පාලන ක්‍රමය මගින් අතිරේක බදු එකතුවක් හැටියට අවම වශයෙන් රුපියල් දශ ලක්ෂ 100 ක මුදලක් ලැබේ යයි අපේක්ෂා කෙරිණ.

1970 ඔක්තෝබර් 27 සහ නොවැම්බර් 2 අතර කාලය තුළ දී මෙම වටිනාකම ඇති නෝට්ටු අයිති හැම කෙනෙකුටම කිසියම් නිශ්චිත සීමාවක් දක්වා ඒවා බැංකුවක් වෙත භාර දී සමාන වටිනාකම ඇති අළුත් නෝට්ටු හුවමාරු කර ගැනීමට අවසර දෙන ලදී. මුලදී රුපියල් 1000 ක් හැටියට නියම කළ උපරිමය, පසුව රුපියල් 250 කටත්, අවසානයේදී රුපියල් 100 කටත් අඩු කරන ලදී. මෙම සීමාවන්ට වඩා වැඩිපුර ඇති විමුද්‍රායනය කළ නෝට්ටු බැංකු ගිණුමක තැන්පත් කළයුතු විය. මුලදී මෙම අරමුණ සඳහා ඉඩදුන් කාලය 1970 නොවැම්බර් 25 වැනිද තෙක් විය. නමුත් පසුව එය 1970 නොවැම්බර් 15 වැනිද හැටියට නියම කෙරිණ. කිසියම් සීමාවක් ඉක්මවා මෙම තැන්පතු ආපසු ගැනීමේදී ඒ සඳහා ආදායම් බදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු විය.

වර්ෂයේ මුල් මාස නවය තුළදී මුදල් සැපයුම රුපියල් දශ ලක්ෂ 182 කින් වැඩි වූයේ, ව්‍යවහාර මුදල් දැරීම් රුපියල් දශ ලක්ෂ 86 කින් වැඩිවීමක් ද සමගමය. මුදල් සැපයුමෙහි වැඩිවීමෙන් කොටසක් රාශිකරණය කිරීමේ ප්‍රවණතාවක් ද, මහජනතාව තුළින් දැකිය හැක. ඒ බව, වර්ෂයේ මුල් කාලයේ දී ඉහල වටිනාකමින් යුත් ව්‍යවහාර නෝට්ටු දැරීම් වැඩිවීමෙන් සනාථ වෙයි. 1970 මැයි අවසානය දක්වා වූ කාලයේදී ව්‍යවහාර මුදල් නිකුතුවෙහි වැඩිවීම රුපියල් දශ ලක්ෂ 80 ක් වූ අතර, රුපියල් 100 හා රුපියල් 50 වටිනාකම යුත් නෝට්ටු දැරීම් රුපියල් දශ ලක්ෂ 63 කින් වැඩි විය. එහෙත් මැයි සහ ජුලි අතර කාලය තුළදී ව්‍යවහාර මුදල් දැරීම අඩුවන ප්‍රවණතාවක් දක්නට තිබුණි. එසේ වූයේ ඉහළ වටිනාකමින් යුත් නෝට්ටු රාශිකරණය කරන්නන්ට විරුද්ධව රජය යම් යම් පියවරයන් ගනිවිය යන අපේක්ෂාවන් හේතුවෙනි. විමුද්‍රායනය තෙක් මුදල් සැපයුමේ ව්‍යවහාර මුදල් අනුපාතයෙහි සැහෙන අඩුවීමක් දිගටම ඇති විය. නිදසුනක් වශයෙන් 1970 දී මුදල් සැපයුම රුපියල් දශ ලක්ෂ 83 කින් වැඩි වූවත්, සංසරණයෙහි පැවති ව්‍යවහාර මුදල් ප්‍රමාණය විමුද්‍රායනයෙහි ප්‍රතිඵලයක් හැටියට රුපියල් දශ ලක්ෂ 148 කින් අඩු විය. මෙම සිදුවීම පසුගිය පනස් ගණන්වල පසු භාගයේ පමණ සිට පැවතෙමින් ආ උපනතියක් සැහෙන අන්දමින් ආපසු හැරීමකි. නමුත් මෙම ආපසු හැරීම ස්ථාවර එකක්ද, නැද්ද යන්න ගැන දැඩි නිගමනයකට ඒමට තරම් කාලයක් තවම ගත වී නොමැත්තේ තැන්පතු කරුවනට අවශ්‍ය ගැලපීම් කර ගැනීමට ප්‍රමාණවත් කාලයක් ලැබී නොමැති බැවිනි. විමුද්‍රායනයෙහි වැදගත් ලක්ෂණයක් වශයෙන් දක්විය හැක්කේ පළමු වතාවට රටේ ජනතාව-ගෙන් සැහෙන කොටසක් බැංකු සමග ගනුදෙනු කළ බවත්, එය කිසිදු සැකයක් නොමැතිව රටේ බැංකු පුරුද්ද විශේෂයෙන්ම ග්‍රාමීය අංශයෙහි වැඩි දියුණු කිරීමට හේතුවන බවත්ය.

විමුද්‍රායනය, මුදල් රාශිකරණය කරන්නන් සහ බදු සඟවන්නන් මැඩ පැවැත්වීමේ අරමුණ ඇතිව රජය මගින් ගත් මූලික පියවරක් වූ අතර, මෙම ව්‍යායාමය ලංකා මුද්‍රා ඉතිහාසයෙහි අසහාය ක්‍රියාවක් විය,

1970 ඔක්තෝබර් 24 වෙනිද වන විට සංසරණයෙහි පැවති විමුලායනය කළ මුළු නෝට්ටුවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 792 කි. එයින් රුපියල් දශ ලක්ෂ 58 ක් වෙළඳ බැංකු වෙත විය. මහජනයා විසින් අළුත් නෝට්ටු වෙනුවෙන් හුවමාරු කරන ලද විමුලායනය කළ නෝට්ටුවල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 153 ක් වූ අතර, බැංකු ගිණුම්වල තැන්පත් කළ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 569 ක් විය.

### 3. 1970 වර්ෂයේ විදේශ ගෙවුම්

1970 වර්ෂයේ ගෙවුම් ශේෂයෙහි කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ ජංගම ගිණුමේ හිඟය අඩුවීමයි. එය ප්‍රධාන වශයෙන්ම රටේ අපනයන කටයුතු වඩා යහපත් තත්ත්වයක තිබීම නිසා සිදු වූවකි. වර්ෂයේ අපනයන ඉපයුම් රුපියල් දශ ලක්ෂ 102 කින්, රුපියල් දශ ලක්ෂ 2,011 දක්වා වැඩි විය. ඒ සමගම ආනයන කපා හැරීම නිසා ආනයන ගෙවීම්වල අඩුවීමක් ද දක්නට ලැබුණි. අපනයන ඉපැයුම් සැලකිය යුතු අන්දමින් වැඩි වීම නිසා, සාපේක්ෂ වශයෙන් වැඩි ආනයන අනුපාතයක් රටේම සම්පත් මගින් පියවා ගත හැකි විය. ඒ නිසා අපනයන ඉපැයුම්වලින් ලබාගත් විනිමය සම්පත්වලට වඩා රුපියල් දශ ලක්ෂ 469 වටිනාකමක් ඇති භාණ්ඩ ප්‍රමාණයක් ආධාර හා සැපයුම් කරුවන්ගේ ණය මගින් ආනයනය කිරීමට ලංකාව සමත් විය.

ගෙවුම් ශේෂයෙහි මූලික වෙනසක්, සේවා ගිණුමෙහි ද දැකිය හැක. එහි හිඟය 1969 දී රුපියල් දශ ලක්ෂ 97 ක සිට 1970 දී රුපියල් දශ ලක්ෂ 143 දක්වා වැඩිවිය. ඉතාමත් විශාල වූ විදේශීය ණය ප්‍රමාණයක් සඳහා වූ පොළී ගෙවීම වැඩිවීම හේතුවෙන් ශුද්ධ වශයෙන් ඉවතට ඇදී ගිය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 101 කි. එය 1968 ගෙවීම මෙන් දෙගුණයකටත් වඩා වැඩිය. 1970 දී සංචාරක කටයුතුවලින් උපයාගත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 17 සිට රුපියල් දශ ලක්ෂ 22 දක්වා තරමක වැඩිවීමක් පෙන්නුම් කළේය. සංචාරක ව්‍යාපාරයෙන් වැඩි ආදායමක් ගත හැකි වීමට, විදේශ විනිමය හිමිකම් සහතික පත් ක්‍රමය තරමක් දුරට උපකාරී විය.

කලින් වර්ෂයට වඩා විදේශ සම්පත් පරතරය පටු වූයේ නමුදු, එම පරතරය පියවා ගැනීම 1970 දී බැරෑරුම් ප්‍රශ්ණයක් විය. රජය හා මහ බැංකුව මගින් විදේශ ණය ආපසු ගෙවීම් 1969 දී රුපියල් දශ ලක්ෂ 361 සිට 1970 දී රුපියල් දශ ලක්ෂ 629 දක්වා සියයට 74·2 කින් වැඩි විය. මෙයින් වැඩි ප්‍රමාණයක් සියයට 72·2 ක් තරමම, ඉතාමත් මෑත කාල-යේදී ගත් කෙටි කාලීන ණය ආපසු ගෙවීම් විය. මේවායින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට වැඩිම ආපසු ගෙවීමක් කරන ලදී. 1969 දක්වා අරමුදලෙන් හැර ගැනීම්, ප්‍රති මිලදී ගැනීම් ඉක්ම විය. එහෙත්, 1970 අමුතුම වර්ෂයක් වූයේ, එම වර්ෂයේදී ප්‍රති මිලදී ගැනීම්, හැර ගැනීම් ඉක්ම වීම, රුපියල් දශලක්ෂ 104 විමය. සම්පත් පරතරය මුළුමණින්ම පියවා ගැනීම සඳහා විදේශ ආධාර හා ණය ප්‍රමාණයන් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 1970 දී රුපියල් දශ ලක්ෂ 78 ක් වූ විශේෂ හැර ගැනීමේ අයිතීන් සඳහා වෙන් කළ මුළු ප්‍රමාණයම ප්‍රයෝජනයට ගැනීමට ලංකාවට සිදු වුනි. 'ගෙවුම් ශෙෂ ප්‍රශ්ණය' යනුවෙන් නම්කර ඇති කොටසින් 1970 ගණන්වලදී ගෙවුම් ශෙෂ තත්ත්වය බැරෑරුම් වීමට බලපෑ කලින් පැවති ප්‍රවණතාවන් විස්තර කෙරී ඇත. මෙම තත්ත්වය, අසමතුලිතාව පිළිබඳ මූලයන්හි විතැන් වීමක් හැටියට මූලික වශයෙන් පෙන්නුම් කෙරෙන අතර ප්‍රාග්ධන ගෙවීම් ඉහළ යාමෙන් හිඟය වැඩිවන සැටි දක්වේ. රුපියල් දශලක්ෂ 1,124 ක්වූ සම්පත් පරතරයෙන් ජංගම ගිණුමෙහි හිඟය සමන්විත වූයේ සියයට 41·6 කින් පමණි. ඉතිරිය වූ රුපියල් දශ ලක්ෂ 656 ක්ම ප්‍රාග්ධන ගෙවීම් සම්බන්ධයෙන් විය. මෙය 1969 තත්ත්වයට වඩා බෙහෙවින් වෙනස් වූවකි. 1969 දී ප්‍රාග්ධන ගෙවීම පියවීම සඳහා ප්‍රයෝජනයට ගත්තේ, සියයට 31·7 ක් පමණි. ඉතිරිය ජංගම ගිණුමේ හිඟය පියවීම සඳහා විය. 1960 මැදි හා අවසාන කාලයන්හිදී ගන්නාලද ණය විශාල ප්‍රමාණයක වරප්‍රසාද ලත් කාලය දැනට අවසාන වී තිබීම නිසාත්, හැටගණන් අවසානයේ ගත් සැපයුම් කරුවන්ගේ ණය දැන් ගෙවීමට සිදු වී ඇති නිසාත්, 1970 ප්‍රාග්ධන ගෙවීම් විශාල ප්‍රමාණයක් මෑත අනාගතයේදී තවදුරටත් වැඩිවිය හැක.

4. මිල

1970 දී මිල ඉහළ යාම, කලින් වසරට වඩා අඩුවෙන් සටහන් වී ඇත. සියයට 5·9 කින් ඉහළ ගිය මිල 1969 දීට වඩා සැහෙන පමණ අඩුව ඇතත්, 1968 පැවති ඉහළ තත්ත්වයට නැකම් කියයි. මිල මට්ටම් ඉහළ නැංවීමට තුඩුදුන් කැපී පෙනෙන සාධක වූයේ, එක් පසෙකින් මුල්‍ය ප්‍රසාරණය කරණ කොට ගෙන ඇති වූ ඉල්ලුම් පීඩනයත්, 1969 හා සසඳන කල පැවති සැපයුමේ හීනකමත්ය. පිරිවැටුම් බද්ද මිල ඉහළ නැංවීමට බලපෑවේය. විශේෂයෙන්ම ආහාර සහ රෙදි පිළි වැනි ද්‍රව්‍යයන්හි මිල ඉහළ ගියේ සැපයුම් කරන රටවල මිල ඉහළ නැංවීම නිසාය.

පසුගිය අවුරුදු කීපයෙහි පැවති සමස්ත ප්‍රවණතාවන් හා සසඳන කල, 1970 දී සිදුවූ මිල ඉහළ යාම සාමාන්‍ය තරමක එකකි. කිසියම් කාලයක් තුළදී සියලුම මිල ඉහළ නැගීමේ ඒකාකාර ප්‍රවණතාවක් පවත්නා ලෝක ආර්ථික ක්‍රමයක, සාපේක්ෂ වශයෙන් ස්ථාවර ලෙස මිල පැවතීමක් හෝ සාමාන්‍ය මිල මට්ටම පහත යන තත්ත්වයක් හෝ දැකීම අපහසුය. සියයට 5 ක පමණ වූ මිල ඉහළ යාමක්, ඉඩ දිය හැකි එකක් මෙන්ම, නිෂ්පාදිත ද්‍රව්‍ය සඳහා මූලික වශයෙන් ආනයන මත රඳා පවත්නා බොහෝ විට දියුණුවන ආර්ථික ක්‍රමවලදී අපේක්ෂා කළයුතු එකක් ද වෙයි.

5. රාජ්‍ය ව්‍යාපාර

පෞද්ගලික අංශයේ ව්‍යාපාරවල, 1969/70 වර්ෂය අවසානයේදී පැවති මුලු ප්‍රාග්ධන ආයෝජනය රුපියල් දශ ලක්ෂ 4215 කි. මෙයින්, කාර්මික ව්‍යාපාරවලට රුපියල් දශ ලක්ෂ 1347·8 ක්ද, සේවා වලට රුපියල් දශ ලක්ෂ 2830 ක්ද, කෘෂිකර්මයට රුපියල් දශ ලක්ෂ 38 ක් ද ආයෝජනය කෙරිණ. 1969/70 සඳහා ඇස්තමේන්තු කෙරුණ පෞද්ගලික අංශයේ කර්මාන්තවල මුලු ලාභය රුපියල් දශ ලක්ෂ 69·9 ක් වූ අතර, අලාභ රුපියල් දශ ලක්ෂ 8.8 ක් විය. මේ අනුව කර්මාන්ත අංශය රුපියල් දශ ලක්ෂ 61·1 ක ශුද්ධ ලාභයක් ලබා දුනි. සේවා අංශයේ ලාභ රුපියල් දශ ලක්ෂ 62 ක් වූ අතර, අලාභ රුපියල් දශ ලක්ෂ 105 ක් විය. මේ නිසා ඉන් රුපියල් දශලක්ෂ 43 ක ශුද්ධ පාඩුවක් විය. අංශත්‍රයම එක්කොට ගත් කල රාජ්‍ය අංශය මගින් උපයන ලද ශුද්ධ ලාභය රුපියල් දශලක්ෂ 16·9 ක් ලෙස ඇස්තමේන්තු කෙරිනි. මුළු ප්‍රාග්ධන යෙදීම්වලට ලත් ඵලදාව ලෙස සලකන කල මෙය සියයට ·04 කි.

රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කොටසෙන් කාර්මික හා සේවා අංශයන්හි සංස්ථාවල එක් එක් ඒවායේ ලාභදායිතාව ගැන විස්තර ලැබේ. ඛනිජ තෙල්, සිමෙන්ති සහ සමුපකාර තොග වෙළඳ, හා රක්ෂණ වැනි සංස්ථා කීපයක මුදල් යෙදීම් අනුව සලකන කල, ඒවාට සාපේක්ෂ ලෙස ඉහළ, එනම් සාමාන්‍යයෙන් රුපියල් දශලක්ෂ 15 ඉක්මවූ ලාභ ඉපයිය හැකි විය. අනික් අතට, යන්තම් ඒවා පවත්වාගෙන යාමට සරිලන සේ සුළු ලාභ උපයන සංස්ථා ගණනාවක් ඇති අතර, ඒවා යම්තමින් සරිලන පහත් ඵලදාවක්, ඉහළ ආයෝජන මට්ටම් ඉදිරියේ නිරූපනය කරයි.

1960 ගණන්වල මුල් කාලය හා සසඳන කල, පාඩු ලබන කාර්මික සංස්ථාවල ගණන සැහෙන පමණ අඩුවී ඇත. ඇත්තෙන්ම 1969/70 දී, පාඩු ලද්දේ කාර්මික සංස්ථා පහක් පමණි. කෙසේ වෙතත්, සේවා අංශයෙහි න්‍යාය වූයේ පාඩු නොලැබීමට වඩා පාඩු ලැබීමය. වැඩිම පාඩු තිබුනේ ලංකා ගමනාගමන මණ්ඩලය හා රජයේ දෙපාර්තමේන්තුවක් ලෙස ක්‍රියාත්මක වන රජයේ දුම්රිය සේවයේයි. මෙම ව්‍යාපාර දෙකෙහි 1969/70 දී ඇස්තමේන්තු කරන ලද පාඩුව, රුපියල් දශලක්ෂ 89·2 ක් වූ අතර, මෙය පොදු අංශයේ සමස්ත ලාභදායිතාව අඩුකිරීමට සැහෙන ප්‍රමාණයකට වග කීවේය. මෙම ව්‍යාපාර දෙක ඉවත්කිරීමට හැකි වුවත් එහිදී පොදු අංශයේ ආයෝජනවල සාමාන්‍ය ඵලද අනුපාතිකය වර්ධනය වීමට හැක්කේ සියයට 2·5 කින්ය.

රටේ ආර්ථික සංවිධානත්වයෙහිලා ප්‍රධාන තැනක් දුන් පොදු අංශයට ලබාදී ඇති අතර, මෙම අංශයේ ව්‍යාපාර, වඩාත් කාර්යක්ෂම හා ගතික ඒකක ලෙස සැලකීමට පටන්ගෙන ඇත. රජයේ මැදිහත්වීම හා නිෂ්පාදනයට සහභාගිත්වය ක්‍රමයෙන්

වැඩිවීමත් සමග ආනයන හා තොග වෙළඳම යනාදි පෞද්ගලික අංශයේ ආර්ථික කටයුතු කාලයාගේ ඇවෑමෙන් හීනවී යන බව පෙනේ. විශේෂයෙන්ම, ආයෝජනයට සම්පත් සැපයීමේදීත් පෞද්ගලික අංශය ඉහතදී කර ඇති මෙහෙය ක්‍රමයෙන් අඩුවී යන ලකුණු පළවේ. සෘජු හා වක්‍ර වශයෙන්, පෞද්ගලික අංශය පරිභෝජන හා ආයෝජන යන කාර්යයන් දෙකෙහිදීම බදු හා ගෙවීම් ලෙස විශාල ප්‍රමාණයක සම්පත් රටේ අයභාරයට එකතු කරයි. සියයට 90 කට වඩා ප්‍රමාණයක විදේශවිනිමය ඉපයීම් පෞද්ගලික අංශයේ කටයුතුවල ප්‍රතිඵල වේ. මෙකී සම්පත් එය විසින් සැපයීමට නම් පොදු අංශයට සීඝ්‍රයෙන් ඒ සඳහා කටයුතු සම්පාදනය කළ යුතුවේ.

පොදු අංශයේ ව්‍යාපාරවලට එම තත්ත්වයට පත්විය හැක්කේ, සිය ලාභ ඉහළ නැංවීමට හා විදේශීය වෙළඳ පොළවල සිය නිෂ්පාදිත හැකිතාක් විකිණීමට ශක්තිය ලදොත් පමණි. මේ ව්‍යාපාර අතුරෙන් බොහොමයකට සීඝ්‍රයෙන් සිය ලාභ ඉහළ නැංවීමට වෙහෙසීමට සිදුවන අතර, විශේෂයෙන් ආන්තික ලාභ ප්‍රමාණයන් ලබන ආයතන ගැන එය එසේම විය යුතුය. රාජ්‍ය ව්‍යාපාර බොහොමයක් ඒකාධිකාරී ඒවාය; ඔවුනට තම නිෂ්පාදන පහසුවෙන් විකුණා ගත හැකිය. මේ නිසා, වඩා පහසුවෙන් යථාර්ථික මිල ප්‍රතිපත්තියක් ගෙනයාමටත්, නිෂ්පාදනවල ගුණය උසස් කිරීමටත්, විශාල පරිමාණයකින් පොදුවියදම් හා පරිපාලන කටයුතු ගෙනයාමෙන් ලැබෙන ආර්ථික පිරිමැසුම් මගින් පිරිවැය අඩුකර ගැනීමටත් හැකිවිය යුතුය. මෙම පරමාර්ථ සපුරා ගැනීමේදී, පොදු අංශයේ වැටුප් මට්ටම්ද ඵලදායිතාව වැඩිකිරීමට තුඩුදෙන ලෙස සකස් විය යුතු අතර, අනාගත වැටුප් වැඩිවීම්, වඩාත් කාර්යක්ෂමතාවයකට හා ඉහළ ඵලදායිතාවකට රුකුල් දෙන අන්දමේ ගෙවීම් ලෙස පිළියෙල කළ හැක.

## (ආ) ගෙවුම් ශේෂ ප්‍රශ්ණය

ලංකාවේ විදේශ විනිමය දුෂ්කරතා දශකයක පමණ කාලයක් තුළ පැවතෙමින් තිබූ අතර, පසුගිය වාර්ෂික වාර්තා හැමෙකකම පාහේ යලි යලිත් ඒ ගැන සඳහන් කෙරී ඇත. 1959/60 දී, අවතීර්ණ වෙමින් පැවති ගෙවුම් ශේෂ අර්බුදය ගැන රජය දැඩි අවධානයක් දැක්වූ අතර, 1960 වාර්ෂික වාර්තාවෙහි සහ එතැන් සිට පළකළ සියලු වාර්තාවලත්, මහ බැංකුව, පිරිහෙමින් පවත්නා විදේශ ගෙවුම් තත්ත්වය ගැන සැලකිල්ල යොමු කළේය. වරින් වර විවිධ ප්‍රතිකර්ම ගන්නා ලද නමුත් ගෙවුම් ශේෂය පිරිහීමට පත්වීම තව දුරටත් සිදුවිය. විදේශීය ගෙවුම් තත්වය පිරිහීමට පසුබිම්වූ සාධක පිළිබඳ විමර්ශනයක් කිරීමට මෙම කොටස ප්‍රධාන වශයෙන් යෙදවෙනු ඇත.

ලංකාවේ විදේශ වෙළඳාම සැහෙන තරමක සෞභාග්‍යයක් ලද කෙටි ජීවිත කාලයන් දෙකක් ඉහතදී දක්නට ලැබුණි. එනම් 1950/51 කොරියන් යුද්ධ සමයේ උත්පාතයේදී රබර් මිල එක්වරම දැඩිසේ ඉහළ යාම සහ 1954/56 කාලයේ තේ මිල සැහෙන පමණ සතුටුදයකවී 1956 දී ගෙවුම් ශේෂයේ අතිරික්තයක් හටගැනීමෙන්, විදේශ සංචිත රුපියල් දශලක්ෂ 1194 ක මට්ටමට වර්ධනයවීමත් යන දෙකය. එතැන් සිට අද වනතුරු විදේශ වත්කම් අනුක්‍රමයෙන් වාගේ පිරිහී යාමට පටන් ගති.

1957 සිටම, 1965 දී හැර, ලංකාව සෙසු ලෝකය හා කළ ගණුදෙනුවලදී ජංගම් ගෙවීම් ඇගේ ජංගම ලැබීම්වලට වඩා වැඩිවිය. 1957 හා 1960 යන කාලය තුළ, මෙම හිඟයනට මූලික හේතුව වූයේ ලංකාවේ ආනයනවලට ඇති ඉල්ලුම් ප්‍රවණතාව, මෙරටට ඇති ආනයන ධාරිතාව ඉක්මවීමය; මෙයට සැලකිය යුතු තරමකට මග පෑදුවේ අපනයන ඉපැයීම් පහළ වැටීමය. ඉහළ ආනයන ඉල්ලුම අනෙක් අතට, බොහෝ දුරට ප්‍රසාරණාත්මක අයවැය හිඟයන් නිසා හටගත්තේය.

**අපනයන ඉපයීම්**

අහිතකර ගෙවුම් ශේෂ තත්වය පිටුපස තිබූ ප්‍රධාන සාධකයක් වූයේ, ලංකාවේ ප්‍රධාන අපනයන ද්‍රව්‍ය විදේශ වෙළඳ පොළවලදී, මුහුණපෑ අයහපත් මිල මට්ටමය. 1-6 සංඛ්‍යා සටහන, ලංකාවේ ප්‍රධාන අපනයන ද්‍රව්‍ය තුන මගින් 1947 සිට වර්ෂයක් පාසා උපයන ලද ආදයම්, රුපියල්වලින් සහ එක්සත් ජනපද ඩොලර් වලින් දක්වමින්, ඊට අදල අපනයන ප්‍රමාණයන්ද පෙන්නුම් කරයි. වටිනාකම් එක්සත් ජනපද ඩොලර්වලින් දක්වා ඇත්තේ, අපනයන මගින් විදේශීය සංචිතයනට එක්කළ නියම තරම පෙන්වීමටය.

1947 දී, තේ රාත්තල් දශලක්ෂ 287 ක් අපනයනය කිරීම මගින් ලංකාව ඩොලර් දශලක්ෂ 170 ක් ඉපයීය. 1970 දී, රාත්තල් දශලක්ෂ 459 ක තේ අපනයන ප්‍රමාණයකින් ඇය ලද මුළු ඉපයීම් ඩොලර් දශලක්ෂ 188 කි. මේ අනුව, 1947 සහ 1970 අතරතුර, ලංකාවේ තේ අපනයන ප්‍රමාණය සියයට 60 කින් ඉහළ ගියද, අපනයන වටිනාකම ඉහළ ගොස් ඇත්තේ සියයට 10 කින් පමණක් බව පෙනේ. අපනයන ආදයම පිළිබඳ මෙම වෙනසට හේතුව, විශේෂයෙන් නවයිය හැට ගණන්වල පැවති ඉතා පිරිහුණු මිල මට්ටමය. අතරතුර කාලයේ, විශේෂයෙන් නවසිය පණස් ගණන්වල මැද භාගයේ තේ අපනයන වෙළඳ පොළ, 1968/70 දී පැවතුණාට වඩා යහපත් විය. 1955 දී, ලංකාව අපනයන කළ තේ ප්‍රමාණය රාත්තල් දශලක්ෂ 362 ක්වූ අතර, ලැබීම් ඩොලර් දශලක්ෂ 250 ක් විය. මෙය තේ උත්පාතයේ මුදුන් අවස්ථාව වූ අතර, තේවලට ඉතා ඉහළ මිල ගණන් ලැබුණි. 1965 දී තේ අපනයන ලැබීම් ඩොලර් දශලක්ෂ 254 කින් ඉහළ නැගීමේදී තේ අපනයන ප්‍රමාණය රාත්තල් දශලක්ෂ 494 ක වාර්තාගත මට්ටමක පැවතුණි. මෙය තේ මිලෙහි දියුණුවක් නිසා නොව, තේ අපනයන ප්‍රමාණයෙහි ඉතා සැහෙන වැඩිවීමක් සිදුවීමෙනි; 1957 සිටම සාමාන්‍යයෙන් මිල අහිතකර ලෙස පැවතුණි. 1960 සිට දිගටම, අපනයන ප්‍රමාණයෙහි වැඩිවීම්, අපනයන මිල පහත යෑම නිසා විදේශ ලැබීම්වල සිදුවූ අඩුවීම තරමක් දුරට කපා හැරියේය; එසේ නමුත් විදේශ විනිමය ඉපයීම් පහත වැටී ඇත.

රබර් අපනයන කටයුතු, තේවලට වඩා සුළු වශයෙන් යහපත් තත්වයක පැවතුණි. 1947 දී, රබර් රාත්තල් දශලක්ෂ 182 ක් අපනයනය කළ අතර ලැබීම් ඩොලර් දශලක්ෂ 39 ක් විය. 1970 දී රාත්තල් දශලක්ෂ 354 ක් අපනයනය කොට ඩොලර් දශලක්ෂ 73 ලබා ගැනුනි. 1947 සිට 1970 දක්වා වූ කාලයෙහිදී, රබර් අපනයනය සියයට 95 කින් ඉහළ ගිය අතර, මුළු අපනයන ලැබීම් සියයට 85 කින් ඉහළ නැගුණි. මෙහිදීද, අපනයනය කළ ප්‍රමාණයෙහි සිදුවූ වැඩිවීම, මිලවලට, වඩා අපනයන ඉපයීම් ඉහළ යැවීමට මග පෑදිය. 1956/57 සහ 1962/64 දීද ඉන්පසු ඉතාම අඩු මිල මට්ටමක් වාර්තා ගත කළ 1967/68 දී ද, මිල ඉතා පහත් තත්වයක පැවතුණි. මෙම සාමාන්‍ය ප්‍රවණතාවෙන් බැහැරවූ එකම අවස්ථාව වූයේ, 1951 දී එනම්, රාත්තල් දශලක්ෂ 229 ක රබර් අපනයනය කොට, රටට ඩොලර් දශලක්ෂ 122 ක් ලැබීමය.

පොල් නිෂ්පාදන පිළිබඳව මිල හා ප්‍රමාණය යන දෙකම අතින් උච්චාවචනයන් සිදුවිය. රබර් අපනයන ප්‍රමාණයන් දිගටම විශේෂයෙන්ම 1964 සිට, පැහැදිළිවම ඉහළ නගින උපනතියක් සාමාන්‍යයෙන් පෙන්නුම් කළද, පොල් නිෂ්පාදන අපනයන පිළිබඳව සිදුවූ උච්චාවචන කැපී පෙනෙන ඒවාය. 1947 දී, පොල් ගෙඩි දශලක්ෂ 572 ක ප්‍රමාණයක් අපනයන කළ අතර, 1952 දී එය දශලක්ෂ 1454 තෙක්ද, 1955 දී දශලක්ෂ 1531 තෙක්ද ඉහළ නැගුණත්, 1958 දී ගෙඩි දශලක්ෂ 890 ක් දක්වා සීඝ්‍රයෙන් පහත වැටුණි. 1964දීඅපනයන ප්‍රමාණය ගෙඩි දශ ලක්ෂ 1618 ක මුදුන් ප්‍රමාණයට පත්වූ අතර, 1969 දී එය ගෙඩි දශලක්ෂ 896 කට සහ 1970 දී ගෙඩි දශ ලක්ෂ 874 කට පහත වැටුණි. 1970 මට්ටම 1958 ට පසු අපනයන කළ අඩුම ප්‍රමාණය වේ. තේ හා රබර් පිළිබඳව මෙන් නොව, පොල් නිෂ්පාදනවල. අපනයන ප්‍රමාණයෙහි පහත වැටීම තරමක් දුරට මිල ඉහළ යාම මගින් කපාහැරුණි නිදසුන් ලෙස, 1962 දී අපනයන ප්‍රමාණයගෙඩි දශලක්ෂ 1530 ක්වූ අතර ඉපයීම්

## 1 – 6 සංඛ්‍යා සටහන

### ලංකාවේ අපනයන පරිමාවන් සහ ඉපැයුම්

| වර්ෂය | තේ | | | රබර් | | | ප්‍රධාන පොල් නිෂ්පාදනත්‍රය | | | මුළු අපනයන* | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පරිමාව රාත්තල් දශ ලක්ෂ | වටිනාකම | | පරිමාව රාත්තල් දශ ලක්ෂ | වටිනාකම | | පරිමාව ගෙඩි දශ ලක්ෂ | වටිනාකම | | වටිනාකම | |
| | | රුපියල් දශ ලක්ෂ | ඩොලර් දශ ලක්ෂ | | රුපියල් දශ ලක්ෂ | ඩොලර් දශ ලක්ෂ | | රුපියල් දශ ලක්ෂ | ඩොලර් දශ ලක්ෂ | රුපියල් දශ ලක්ෂ | ඩොලර් දශ ලක්ෂ |
| 1947 .. .. | 287·3 | 567 | 170·8 | 182·2 | 137 | 39·2 | 572 | 93 | 28·0 | 829 | 267·8 |
| 1948 .. .. | 296·0 | 590 | 177·7 | 207·3 | 143 | 43·1 | 970 | 153 | 46·1 | 1011 | 304·5 |
| 1949 .. .. | 297·6 | 650 | 195·8 | 197·0 | 125 | 37·7 | 940 | 168 | 50·6 | 1063 | 320·2 |
| 1950 .. .. | 298·1 | 752 | 158·0 | 255·1 | 405 | 85·1 | 1030 | 248 | 52·1 | 1563 | 328·4 |
| 1951 .. .. | 305·2 | 800 | 168·1 | 229·1 | 582 | 122·3 | 1263 | 320 | 67·2 | 1904 | 400·0 |
| 1952 .. .. | 314·5 | 723 | 151·9 | 209·8 | 373 | 78·4 | 1454 | 232 | 48·7 | 1502 | 315·5 |
| 1953 .. .. | 335·6 | 825 | 173·3 | 217·3 | 338 | 71·0 | 1262 | 244 | 51·3 | 1568 | 329·4 |
| 1954 .. .. | 361·3 | 1123 | 235·9 | 209·4 | 285 | 59·9 | 1171 | 212 | 44·5 | 1809 | 380·0 |
| 1955 .. .. | 362·2 | 1194 | 250.8 | 222·3 | 50 | 73·5 | 1531 | 225 | 47·3 | 1940 | 407·6 |
| 1956 .. .. | 348·1 | 1044 | 219·3 | 193·0 | 293 | 61·6 | 1418 | 213 | 44·7 | 1735 | 364·5 |
| 1957 .. .. | 368·1 | 1022 | 214·7 | 208 6 | 300 | 63·0 | 950 | 156 | 32·8 | 1682 | 353·4 |
| 1958 .. .. | 411·2 | 1132 | 237·8 | 207·2 | 258 | 54·2 | 890 | 164 | 34·5 | 1711 | 359·5 |
| 1959 .. .. | 383·8 | 1046 | 219·7 | 205·8 | 298 | 62·6 | 1140 | 244 | 51·3 | 1754 | 368·5 |
| 1960 .. .. | 410·2 | 1096 | 230·3 | 234·6 | 378 | 79·4 | 976 | 184 | 38·7 | 1832 | 384·9 |
| 1961 .. .. | 426·0 | 1115 | 234·2 | 197·3 | 260 | 54·6 | 1355 | 202 | 42·4 | 1733 | 364·1 |
| 1962 .. .. | 452·0 | 1149 | 241·4 | 224·5 | 290 | 60·9 | 1530 | 227 | 47·7 | 1808 | 379·8 |
| 1963 .. .. | 455·9 | 1140 | 239·5 | 209·5 | 257 | 54·0 | 1208 | 198 | 41·6 | 1731 | 363·7 |
| 1964 .. .. | 455·7 | 1142 | 239·9 | 253·2 | 290 | 60·9 | 1618 | 273 | 57·4 | 1876 | 394·1 |
| 1965 .. .. | 494·6 | 1210 | 254·2 | 266·8 | 304 | 63·9 | 1270 | 275 | 57·8 | 1949 | 409·5 |
| 1966 .. .. | 441·3 | 1027 | 215·8 | 298·4 | 337 | 70·8 | 1017 | 196 | 41·2 | 1700 | 357·1 |
| 1967 .. .. | 477·7 | 1061 | 222·9 | 290·9 | 282 | 59·2 | 940 | 167 | 35·1 | 1690 | 355·0 |
| 1968 .. .. | 460·2 | 1162 | 195·4 | 328·3 | 331 | 55·6 | 1096 | 331 | 55·6 | 2035 | 342·0 |
| 1969 .. .. | 444·5 | 1062 | 178·5 | 314·8 | 431 | 72·4 | 896 | 221 | 37·1 | 1916 | 322·0 |
| 1970 .. .. | 459·7 | 1120 | 188·2 | 354 2 | 440 | 73·9 | 874 | 237 | 39·8 | 2033 | 341·7 |

මූලය: ලංකා රේගු වාර්තා

* ප්‍රතිඅපනයනද ඇතුළත්ය.

විනිමය අනුපාතයන් – 1947–49 : එ·ජ· ඩොලර් 1 = රුපි· 3·32 (1949 සැප්තැම්බරයේදී රුපියල අවප්‍රමාණය කරන ලදි.)
1950-67 : එ·ජ· ඩොලර් 1 = රුපි· 4·76 (1967 නොවැම්බරයේදී රුපියල අවප්‍රමාණ කරන ලදී.)
1968– සිට : එ·ජ· ඩොලර් 1 = රුපි· 5·95

ඩොලර් දශලක්ෂ 47 වුවද, 1965 දී ගෙඩි දශලක්ෂ 1270 ක අපනයන සඳහා, ඩොලර් දශලක්ෂ 57 ක ඉපයීම් විය. 1969 දී හා 1970 දී ප්‍රමාණය ඉතා දැඩියේ පහළ ගියද, ඉහළ මිල මගින් ඉපයීම් පිළිවෙලින් ඩොලර් දශලක්ෂ 37 සහ ඩොලර් දශලක්ෂ 39 ලෙස පවත්වා ගැනුනි. සාමාන්‍යයෙන් බලන කල, ප්‍රමාණයන්හි උච්ඡාවචන මධ්‍යයෙහි පවා, පොල් නිෂ්පාදනවලින් ලද අපනයන ඉපයීම් වඩා වැඩි ස්ථායිතාවක් පිළිබිඹු කළ අතර, අපනයන ප්‍රමාණයන්හි අඩුවීම්, මිල සාධකය මගින් නිරන්තරව කපා හැර තිබේ.

සියලුම අපනයන සැලකිල්ලට ගත්කල, 1970 අගදී ඉපයීම් ඩොලර් දශලක්ෂ 341 ක්වූ අතර එය 1954 හා 1968 අතරවූ ඕනෑම වර්ෂයක ආනයන ඉපයීම්වලට වඩා අඩුවිය. 1947 දී ප්‍රධාන අපනයන තුනෙන් වූ මුළු ලැබීම් ඩොලර් දශලක්ෂ 267 ක් විය. 1958 දී එය ඩොලර් දශලක්ෂ 328 ක්ද, 1970 දී ඩොලර් දශලක්ෂ 341 ක්ද විය. මේ අනුව පෙනී යන්නේ, 1950 සිට වර්ෂ 20 ක කාල පරිච්ඡේදයක් තුළ මුළු අපනයන ලැබීම්වල වැඩිවීම වූයේ ඩොලර් දශලක්ෂ 13 කින් හෙවත් සියයට 4 කින් බවය.

**වෙළඳ අනුපාතය**

ඉහතකී ප්‍රවනතාවන්, ආනයන මිල වෙනස්කම්වල බලපෑමද සැලකිල්ලට ගනු ලබන වෙළඳ අනුපාතය තුළින් වඩාත් නිරූපනය වෙයි. 1961 සිට වෙළඳ අනුපාතය ක්‍රමයෙන් පිරිහී ඇත. 1962 හා 1964 අතරතුර, වෙළඳ අනුපාතයේ දර්ශකය (පදනම 1967=100) 142 සිට 105 දක්වා පහත වැටීමෙන්, සියයට 26 කටත් වඩා පිරිහීමක් පෙනී යයි. යළිත්, 1965 හා 1969 අතරතුර දර්ශකය 112 සිට 88 තෙක්, එනම් සියයට 21 කටත් වඩා හීනවීමක් සිදුවිය.

වෙළඳ අනුපාතයේ අයහපත් හැඩගැසීම නිසා, ගෙවුම් ශේෂයේ හටගත් ප්‍රශ්නයෙහි ප්‍රමාණය පහත සඳහන් සටහනෙන් මැනගත හැක.

**I – 7 සංඛ්‍යා සටහන**

**වෙළඳ අනුපාතයේ වෙනස් වීමෙන් බලපෑම් ලද ජංගම ගිණුමේ වූ හිඟයන් 1960 – 1970[1]**

රුපියල් දශලක්ෂ

| වර්ෂය | ජංගම ගිණුමේ ශේෂය | වෙළඳ අනුපාතයේ බලපෑම |
|---|---|---|
| 1960 | – 220 | – 11 |
| 1961 | – 94 | – 151 |
| 1962 | – 140 | – 82 |
| 1963 | – 168 | – 242 |
| 1964 | – 160 | – 316 |
| 1965 | 59 | – 309 |
| 1966 | – 290 | – 505 |
| 1967 | – 288 | – 667 |
| 1968 | – 355 | – 784 |
| 1969 | – 797 | – 811 |
| 1970 | – 503 | |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1· වෙළඳ අනුපාතයෙහි වෙනස්කම් නිසා හටගත් ආදයමෙහි අඩුවීම් ලබාගෙන ඇත්තේ, අපනයනවල නැ·වි·ස· අගය, පළමුවෙන් ආනයන මිල දර්ශකයෙනුත් අනතුරුව අපනයන මිල දර්ශකයෙනුත්, අවධමනය කිරීම මගිනි· වෙළඳ අනුපාතය ලංකාවට හානිකර ලෙස හැඩගැසී ඇති නිසා, මෙම සංඛ්‍යාවන් දෙක අතර ඇති වෙනසින්, ලංකාවේ අපනයන ඇගේ ආනයන උදෙසා හුවමාරුවීමේ අනුපාතය අනුව ඇතිවන ආදයමේ පාඩුව පෙන්වයි.

1965 සිට දිගටම, වෙළඳ අනුපාතයේ පහත වැටීමෙහි බලපෑම වැඩි වූ කල වෙළඳ අනුපාතයෙහි අවාසිදයක හැඩගැසීම නිසා ලංකාවට 'පාඩුවන' විනිමය ප්‍රමාණය, ජංගම ගිණුමේ හටගත් හිඟයට වඩා වැඩි බව මෙයින් පෙනේ. තවත් ලෙසකින් කියතොත්, ආනයන හා අපනයන මිල 1959 පැවති මට්ටමෙම පැවතුනි නම්, 1965 සිට

1969 දක්වා කෙරුණ නියම අපනයන හා ආනයන ප්‍රමාණය, සැබැවින්ම ජංගම ගිණුමේ හිඟයයන් වෙනුවට, අතිරික්තයන් ලබාදීමට තුඩුදිය යුතුය. වෙළඳ අනුපාතය පිරිහීමට උපකාරිවූ සාධක කිපයක් අතුරින් වඩාත් වැදගත් වන්නේ;

(අ) ලංකාව සිය ආනයන වෙනුවෙන් ගෙවන මිලවල වූ තියුණු ඉහළ යාම. ඊට අමතරව, සූවස් ඇළ වසා දැමීමෙන් හටගත් ප්‍රවාහණ වියදම්වල ඉහළ යාම්වලට අතිරේකව, ලංකාවට මෑත කාලයේදී ප්‍රවාහන ගාස්තු පිළිබඳ වූ වැඩිකිරීම් කීපයකට මුහුණ පෑමට සිදු වීම.

(ආ) ලංකාවේ ප්‍රධාන අපනයන - තේ හා රබර්වලට ලැබුණ සාපේක්ෂ අඩු මිල; තේමිල නවසිය හැට ගණන්වල මෑත භාගයේදී පත්වූ පහත් මට්ටමේම රඳ පැවතීමට තුඩු දුනි. ස්වභාවික රබර්වලට, කෘත්‍රිම රබර්වලින් හටගත්, වැඩිවන තරගයටත් ප්‍රධාන බලවතුන්ගේ තොග රක්කිරීමේ ප්‍රතිපත්ති නිසා හටගත් අවිනිශ්චිත තාවයටත් මුහුණ පෑමට සිදු වීම.

(ඇ) ණය හෝ ආධාර විධිවිධාන යටතේ ලබාගත් ආනයන සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් ඉහල මිලක් ගෙවීමට සිදු වීම.

**ගෙවුම් ශේෂ ප්‍රතිපත්තිය**

1957 සිට 1960 දක්වා ගෙවුම් ශේෂයේ හටගත්, ජංගම ගිණුම හා සම්බන්ධ හිඟයයන් මෙරට ආර්ථිකය මත එතරම් දැඩි බරක් පැටවීමට හේතු නුවූයේ, හිඟයයන්ට මුදල් සැපයීමට තරම් ප්‍රමාණවත් විදේශීය වත්කම් සංචිත තිබූ බැවිනි. 1960 වන විට පැහැදිලි වූයේ, මෙතාක් ලංකාව ගෙන ගිය ලිහිල් වෙළඳ ප්‍රතිපත්තිය තව දුරටත් පවත්වා ගත නොහැකි බවය. විදේශ වත්කම් 1956 අගදී පැවති රුපියල් දශලක්ෂ 1,194 ක මට්ටමේ සිට රුපියල් දශලක්ෂ 457 ක් බවට 1960 අගදී සීඝ්‍රයෙන් පහත බැස්සේ ප්‍රධාන වශයෙන්ම අපනයන ඉපයීම්වලට වඩා ආනයන ගෙවීම් ඉහළ වීමේ ප්‍රතිඵලයක් ලෙසය. මේ අනුව ගෙවුම් ශේෂ ප්‍රතිපත්තියක් අවශ්‍ය වූ අතර, ආනයන සහ විනිමය පාලනය වඩාත් දැඩි සේ ගෙන යාම කළ හැකි එකම දෙය විය. මෙම පාලනයන්, 1968 මැයි මස සිට 1970 අගෝස්තු මස දක්වා විදේශ විනිමය හිමිකම් සහතික ක්‍රමය යටතේ වූ කෙටි සහනදායී කාලය හැරුණු කොට මේ දක්වා එලෙසම පැවතේ. දැඩි පාලන නීති තිබුණත්, 1961 සිට 1964 දක්වා වූ කාලයේදී, විදේශ වත්කම් අඩු වේගයකින් නමුත් පිරිහීම දිගටම සිදු වූ අතර, ඒ නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් හැර ගැනීම් කිරීමට 1961 දී හා 1962 දී සිදු විය.

1960 දී මහ බැංකුව ආනයන පාලනය සඳහා ගත් මූල්‍ය පියවර හැරුණු කොට, ගෙවුම් ශේෂය හැඩගැස්වීම සඳහා තවත් ප්‍රතිපත්තිද යොද ගන්නා ලදී. 1961 සිටම ආන්තික සංචිත අවශ්‍යතා රැක ගන්නා ලද අතර, 1965 සිට පෞද්ගලික අංශයට දෙන බැංකු ණය පිළිබඳ සීමා පවත්වා ගන්නා ලදී. බැංකු පොළිය හතර විතාවකදී ඉහළ නංවන ලද අතර, 1959 පැවති සියයට 2½ ක් වූ පොළී ප්‍රමාණය අද සියයට 6½ කි. රජයේ බැඳුම්කර අනුපාතිකයන් පිළිබඳවද මහ බැංකුව ක්‍රමයෙන් ඉහළ ප්‍රමාණයන් සඳහා මග පෙන්වූ අතර, එය 1959 පැවති සියයට 3½ සිට, වර්තමානයෙහි සියයට 9 ක් බවට පත් වී ඇත. 1967 දී රුපියල සියයට 20 කින් අවප්‍රමාණ කරන ලද අතර 1968 දී අදළ මූල්‍ය පියවර සමග විදේශ විනිමය හිමිකම සහතික පත්‍ර ක්‍රමය හඳුන්වා දෙන ලදී.

විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය විදේශ විනිමය ගෙවීම් විශාල ප්‍රමාණයක් මත අතිරේක බද්දක් ලෙසින් ක්‍රියාත්මක වූ අතර, ඇතැම් වර්ගවල විදේශ විනිමය ලැබීම් සඳහා වාසි සලසා දුනි. විවිහිස ක්‍රමයේ අරමුණ වූයේ, තෝරාගත් අපනයන සහ අදෘශ්‍ය ගණුදෙනු සඳහා මුදලින් අනුබල සැපයීමත්, එබඳුම තෝරාගත් ආනයන සහ අදෘශ්‍ය ගෙවීම්

සඳහා අතිරේක රුපියල් වියදමක් නියම කිරීමත්ය. 1968 හා 1969 දී ආයෝජන භාණ්ඩ හා අමු ද්‍රව්‍ය ආනයන වල සැහෙන ඉහළ යාම සලකා බලන කල, කර්මාන්තවල පවත්නා ධාරිතාව මුළුමණින්ම භාවිත කිරීමට, විවිහිස මගින් පැදූ ආනයන ලිහිල් කිරීමේ අවස්ථාව ප්‍රයෝජනයට ගැණුන බව පෙනී යනු ඇත. තවද, වාසිදායක විනිමය අනුපාතයේ අනුබල ලැබ සුලු අපනයන පසුගිය වර්ෂ දෙක තුළදී කිසියම් ප්‍රසාරණයක් පෙන්නුම් කර ඇත. එනමුත්, විවිහිස යටතේ අපනයන කරුවන්ට වූ වාසි තරමක් දුරට අඩු කිරීමට, අපනයන තීරු බදු ඉහළ නැංවීම හේතු විය. මෙම අපනයනයන්හි ප්‍රමාණය සැහෙන පමණ ප්‍රසාරණය වීමට සාමාන්‍යයෙන් වර්ෂ කිපයක් ගතවන බව සලකා බලන විට, මේ තාක් ලබා ඇති දියුණුව, විවිහිස ක්‍රමයේ ප්‍රයෝජනවත් බවට නිදසුන් සපයයි. විවිහිස මගින් විදේශ විනිමය ඉපයීම් ඉහළ නැංවීමට බලපෑ තවත් අංශයක් වනුයේ සංචාරක ව්‍යාපාරයයි.

**සම්පත් පරතරයට මුදල් සැපයීම**

1 - 8 සංඛ්‍යා සටහනෙන්, ලංකාව 1952 සිට විදේශ සම්පත් පරතරය පියවීමට මුදල් සපයාගත් අන්දම පෙන්නුම් කෙරේ. එමෙන්ම එකි පරතරයන් පියවීමේදී කෙතෙක් දුරට විදේශාධාර මත රඳ පැවතුනිද යන්නත් ඉන් දක්වේ. කලින් වර්ෂවලදී විශේෂයෙන් 1957 සිට 1960 දක්වා, ලංකාව පිටරටවලට වූ වගකීම් පියවීමට සිය විදේශීය සංචිත ප්‍රයෝජනයට ගෙන ඇත. 1960 දක්වා (1954 දී හැර) යෝජනා ක්‍රම ආධාර වර්ෂයකට රුපියල් දශලක්ෂ 23 කට වැඩි නොවූ අතර, මුලු ආධාරවලින් ප්‍රධාන කොටස සමන්විත වූයේ පරිත්‍යාගවලිනි. 1957 දී, හිඟය පියවීමට ලංකාව තම විදේශ සංචිත සැහෙන තරමකින් යෙදවූ නමුත්, සම්පත් පරතරයෙන් 1/5 කට කිට්ටු ප්‍රමාණයකට මුදල් සැපයුනෙ යෝජනාක්‍රම ආධාර, පරිත්‍යාග සහ විදේශ ප්‍රාග්ධන ගැලීම් මගිනි. මෙම රටාව 1960 දක්වා, පුළුල් වශයෙන් එලෙසම පැවතුනි.

කැපී පෙනෙන ලක්ෂණයක් වනුයේ, 1957 සිට 1970 දක්වා සම්පත් පරතරයේ සිදු වූ ප්‍රකට වැඩි යාම වන අතර, ඉන් සැහෙන කොටසක් ආධාර දෙන රටවල් හා ඇති වූ කතිකා පදනම් කොට ගෙන පියවන ලදී. 1966 දී හටගත් රුපියල් දශලක්ෂ 541 ක් වූ විදේශ සම්පත් පරතරය, 1952 සිට 1966 දක්වා ඇති වූ ඉහළතම එක විය. 1952 හැරුණු විට, ඉහත දී තිබූ ඉහලම පරතරය 1959 දී පැවති රුපියල් දශලක්ෂ 328 විය. විදේශ සම්පත් පරතරය, 1966 පැවති රුපියල් දශ ලක්ෂ 541 සිට, 1968 දී රුපියල් දශලක්ෂ 649 ක් බවටත්, 1969 දී රුපියල් දශලක්ෂ 1235 බවටත්, අනතුරුව 1970 දී රුපියල් දශලක්ෂ 1,124 ක් බවටත් පත්විණ.

1961 දී, ගෙවුම් ශේෂ අර්බුදය සම්බන්ධව විශේෂ පියවර ගැනීමත් සමග, හිඟය පියවීමට මුදල් ලබාගන්නා මාර්ගවල ප්‍රමාණවත් වෙනසක් හටගත්තේය. 1957 - 60 තුළදී පුරුද්ද වූ විදේශ සංචිත ප්‍රයෝජනයට ගැනීම තවදුරටත් නොකළ හැකි විය. සෙසු මාර්ගවලට වඩ වඩාත් යොමු වියයුතු විය. පළමු වරට 1961 දී ලංකාව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් හැර ගැනීම් කළ අතර, සිය විදේශීය හිඟයෙන් $\frac{1}{4}$ ක් පමණ පියවීමට ඒ වසරේ එය යොද ගැනුනි. 1961 සහ 1965 අතරතුර, ජා. මු. අ. කළ හැර ගැනීම්වලින් හිඟයන්ගෙන් කොටසකට මුදල් සැපයුන බව, 1961, 1962, 1965 වර්ෂවලින් පෙනී යයි. සෙසු මාර්ග වූයේ යෝජනා ක්‍රම ආධාර, පරිත්‍යාග. පෞද්ගලික ප්‍රාග්ධනය සහ කෙටි කාලීන ණයයි. යෝජනා ක්‍රම ආධාර මගින් හිඟ මුදල් සම්පාදනය ඉක්මණින් ආපසු ගෙවීමේ ප්‍රශ්න මතු නොකළේ, මෙම ණයවලින් බොහොමයකට සහනදායක කාලයක් තිබූ නිසාය. සමාලෝචනයට ලක්වන කාලය තුළදී, පරිත්‍යාග, සෑම වර්ෂයකදීම රුපියල් දශලක්ෂ 37 කට වඩා වූ අතර, 1964 දී එය රුපියල් දශලක්ෂ 76 තෙක් ඉහළ නැගුණි. එය ආපසු ගෙවීමක් කළ යුතු නැති නිසා බරක් පැටවුනේ නැත. කෙටි කාලීන ණය රුපියල් දශලක්ෂ 7. සිට රුපියල් දශලක්ෂ 39 ක් දක්වා ප්‍රමාණයක විහිදුණ අතර, ඒවායේ ප්‍රමාණය පිළිබඳ ඇසින් බලන කල, ගෙවීම් තත්ත්වය මත එතරම් පීඩනයක් ඇති කළේ නැත. 1961 සිට 1965 කාලය තුළ අවුරුදු තුනේ සිට සහ දක්වා කාලයකදී ආපසු ගෙවීමට සිදු වූ එකම ණය වර්ගය, ඉහත සඳහන් කළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හැර ගැනීම් විය. 1965 දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හැර ගැනීම් මගින්, රුපියල් දශලක්ෂ 126 ක විදේශ සම්පත් පරතරයෙන්, රුපියල් දශලක්ෂ 110 ක් දක්වා මුදල් සැපයුනි.

22456
21 APR 2009
LIBRARY INFORMATION CENTRE

## I - 8 සංඛ්‍යා සටහන
## ලංකාවේ විදේශ සම්පත් පරතරය සහ පියවූ මාර්ග 1952 - 1970

(ලංකා රුපියල් දශලක්ෂ වලින්)

| | 1952 | 1953 | 1954 | 1955 | 1956 | 1957 | 1958 | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1968 | 1969 | 1970 අ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. මුළු විදේශ විනිමය ඉපයුම් (භාණ්ඩ සහ සේවා) | 1,648 | 1,796 | 2,015 | 2,201 | 2,036 | 1,995 | 1,956 | 2,056 | 2,050 | 1,937 | 1,992 | 1,924 | 1,955 | 2,116 | 1,885 | 1,866 | 2,231 | 2,178 | 2,264 |
| 2. මුළු ආනයන ගෙවීම් (භාණ්ඩ සහ සේවා) .. | 2,107 | 1,958 | 1,733 | 1,895 | 2,032 | 2,217 | 2,164 | 2,309 | 2,323 | 2,072 | 2,173 | 2,135 | 2,192 | 2,121 | 2,237 | 2,200 | 2,615 | 3,021 | 2,732 |
| 3. මුළු ප්‍රාග්ධන ගෙවීම් .. | 28 | 79 | 73 | 85 | 99 | 92 | 29 | 75 | 36 | 37 | 12 | 17 | 86 | 121 | 189 | 80 | 265 | 392 | 656 |
| 4. මුළු ජංගම සහ ප්‍රාග්ධන ගෙවීම් .. | 2,135 | 2,037 | 1,806 | 1,980 | 2,131 | 2,309 | 2,193 | 2,384 | 2,359 | 2,109 | 2,185 | 2,152 | 2,278 | 2,242 | 2,426 | 2,280 | 2,880 | 3,413 | 3,388 |
| 5. විදේශ සම්පත් හිඟය .. | - 487 | - 241 | + 209 | + 221 | - 45 | - 314 | - 237 | - 328 | —309 | - 172 | - 193 | - 228 | - 323 | - 126 | - 541 | - 414 | - 649 | - 1,235 | - 1,124 |
| 6. හිඟය පියවීම .. | | | | | | | | | | | | | | | | | | | |
| (අ) යෝජනා ක්‍රම ආධාර .. | — | — | 70 | 8 | 6 | 23 | 22 | 16 | 20 | 19 | 40 | 82 | 78 | 77 | 76 | 34 | 40 | 89 | 36 |
| (ආ) ද්‍රව්‍ය ආධාර .. | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | 107 | 178 | 255 | 272 | 263 |
| (ඇ) පරිත්‍යාග .. | 13 | 3 | 24 | 17 | 28 | 27 | 55 | 44 | 53 | 41 | 37 | 44 | 76 | 64 | 63 | 46 | 28 | 46 | 75 |
| (ඈ) පෞද්ගලික ප්‍රාග්ධනය .. | 53 | 9 | 15 | 6 | 40 | 21 | 25 | 18 | 14 | 19 | 10 | 9 | 7 | 2 | 6 | 17 | 9 | 9 | 10 |
| (ඉ) ද්විපාර්ශ්වීය වෙළඳ ශේෂවල වෙනස්වීම | — | — | — | — | — | — | — | — | — | 16 | - 14 | 39 | 19 | - 69 | 30 | 80 | 42 | 18 | - 75 |
| (ඊ) කෙටිකාලීන ණය .. | 23 | — | — | — | — | — | 55 | 48 | — | 28 | 7 | 8 | 39 | 26 | 2 | 7 | 84 | 185 | 434 |
| (උ) සැපයුම්කරුවන්ගේ ණය .. | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | 176 | 85 |
| (ඌ) බැංකු ණය ගැනීම් .. | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | 57 | — | 227 | 123 |
| (එ) ජා·මු·අ· හැරගැනීම් .. | — | — | — | — | — | — | — | — | — | 54 | 54 | — | — | 110 | 144 | 123 | 213 | 77 | 57 |
| (ඒ) විදේශ වත්කම්වල වෙනස්වීම .. | 348 | 230 | - 288 | - 260 | - 25 | 236 | 60 | 199 | 193 | 10 | 28 | 42 | 111 | - 89 | 122 | - 131 | - 14 | 86 | - 26 |
| (වැඩිවීම = - ) .. | | | | | | | | | | | | | | | | | | | |
| (අඩුවීම = + ) .. | | | | | | | | | | | | | | | | | | | |
| (ඔ) අනිකුත් ණය සහ ණය මාර්ග .. | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | 33 |
| (ඕ) විශේෂ හැර ගැනීමේ අයිතීන් .. | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | 78 |
| (ක) වෙනත් .. | — | 1 | 2 | — | — | — | 46 | — | — | 5 | — | 1 | 2 | 9 | 9 | 15 | 12 | 32 | 20 |
| වැරදි සහ අත්හැරීම් .. | + 49 | - 2 | - 28 | + 8 | - 3 | + 7 | - 26 | + 3 | + 30 | — 20 | + 31 | + 3 | - 6 | - 6 | - 18 | - 12 | - 22 | + 18 | + 11 |
| පියවීමේ එකතුව | + 487 | + 241 | - 209 | - 221 | + 45 | + 314 | + 237 | + 328 | + 309 | + 172 | + 193 | + 228 | + 323 | + 126 | + 541 | + 414 | + 649 | + 1,235 | + 1,124 |

අ. බෙහෙවින් තාවකාලිකය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: 1. විදේශ වත්කම්වල වෙනස සංඛ්‍යා සටහනෙහි 1959 සිට විදේශ වත්කම්වල දක්වා ඇති වෙනස හා සම වෙයි. මෙම සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති එම වර්ෂයට පෙර විදේශීය වත්කම් විදේශ පොත් අනුව වේ. මක්නිසාද යත්, ප්‍රකාශිත ගෙවුම් ශේෂ දත්තයන්, විශේෂයෙන් මූල්‍ය අංශයට සම්බන්ධද්‍ර පදනම්වී ඇත්තේ විදේශ වාර්තා මත නිසාය.

2. කෙටි කාලීන ණය ආනයන පිළිබඳ සියළුම දත්තයන් වාර්තාගත කරන ලද්දේ 1968 සිටය. ඊට පෙර සංඛ්‍යා දක්වනුයේ ණය ආනයන නිසා කෙටිකාලීන වගකීම්වල ශුද්ධ වෙනස පමණි. තවද, මේවා ප්‍රධාන වශයෙන් බුරුමයෙන් ආනයනය කළ සහල් සහ ඕස්ට්‍රේලියාවෙන් ආනයනය කළ පිටි සම්බන්ධවයි.

1966 සහ 1970 අතරතුර තැත් කළ උපක්‍රමය වූයේ, වෙළඳ අනුපාතය පිරිහීමෙන් හටගත් ප්‍රතිවිපාක අභිබවාලීමට විදේශ ණය ගැනීම්වලට තව තවත් යොමුවීම මගින් ආනයන සඳහා මුදල් සපයා ගැනීමය. වෙළඳ අනුපාතය යහපත්ව පැවතියේ නම්, විදේශාධාර රහිතව රටේ සංවර්ධන වැඩ පිළිවෙලේ සැලකිය යුතු කොටසකට මුදල් සැපයීමට රටට හැකිවනු ඇත. මෙම ප්‍රතිපත්තිය සැහෙන තරමක විදේශීය ණයක් එක් රැස්වීමට හේතු විය. මේ නිසා ලංකාවට පිරිහෙන වෙළඳ අනුපාතයකින් හට ගන්නා ප්‍රශ්නවලට පමණක් නොව, සිය විදේශ ණය සමුච්චිතය නිසා හටගන්නා ප්‍රශ්නවලට ද මුහුණ පෑමට සිදු වී ඇත.

1966 සිට, සම්පත් පරතරය පියවීමට විවිධ ක්‍රම කීපයක් යොදු ගැනිණ. පළමු වරට, 1966 දී ද්‍රව්‍යාධාර සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හැර ගැනීම් පමණක් විදේශ සම්පත් පරතරයෙන් සියයට 45 කට පමණ මුදල් සැපයීය. 1967 දී, මෙම මූලයන් දෙකෙන් මුදල් සැපයුණ ප්‍රමාණය සම්පත් පරතරයෙන් සියයට 60 කට වැඩි වූ අතර, 1968 දී එය සියයට 70 ඉක්ම විය. කෙටි කාලීන ණය සහ ජා. මු. අ. හැර ගැනීම් පිළිබඳව ඇති ප්‍රශ්නය වනුයේ ඒවා සාමාන්‍යයෙන් අවුරුදු කීපයකදී නැවත ගෙවිය යුතු වීමය.

1969 සහ 1970 දී, විදේශ සම්පත් පරතරය සඳහා මුදල් සැපයීමට තවත් මාර්ග කරා යොමු විණ. පළමු වරට, 1969 දී සැහෙන ප්‍රමාණයකින් වෙළඳ බැංකු ණය ප්‍රයෝජනයට ගත් අතර, එය සම්පත් පරතරයෙන් 1/5 කට පමණ මුදල් සැපයීය. මේ හැර ජා. මු. අ. හැර ගැනීම්, සැපයුම් කරුවන්ගේ ණය, සහ කෙටි කාලීන ණය තවත් 2/5 කට මුදල් සැපයූ අතර, සෙසු කොටස, 'බොහෝදුරට ද්‍රව්‍යාධාර මගින් පියවුනි. මෙසේ 1969 දී ද්‍රව්‍යාධාර, කෙටි කාලීන ණය, සැපයුම් කරුවන්ගේ ණය සහ බැංකුවලින් ගැනීම් එකතුවීමෙන්, රුපියල් දශ ලක්ෂ 1,235 ක්වූ මුලු සම්පත් පරතරයෙන් රුපියල් දශ ලක්ෂ 1,000 කට වඩා මුදල් සැපයුනි. මෙම රටාව, 1970 සම්පත් පරතරය පියවීමේ දී අනුගමනය කෙරුණ අතර, එකම වෙනස වූයේ ද්‍රව්‍යාධාර රුපියල් දශ ලක්ෂ 263 ක් සහ කෙටි කාලීන ණය රුපියල් දශ ලක්ෂ 430 ක් ලෙස වූ ඉහළ මට්ටමකින් වාර්තා ගත වීමය.

1960 සිට 1965 කාලය තුළ, භාණ්ඩ හා සේවා ආනයන පිළිබඳ වියදම් (විනිමය පාලන දත්තයන් අනුව) රුපියල් දශ ලක්ෂ 2150 පමණ සාමාන්‍යයකින් පවත්වා ගැනුණි. 1966 හා 1967 දීත්, අපනයන ඉපයීම්වල සැහෙන අඩුවීමක් යටතේ පවා, මෙම මට්ටම පවත්වා ගැනුණි. නමුත් 1968 දී, විදේශ විනිමය ඉපයීම් රුපියල් වශයෙන් සුලු ඉහළ යෑමක් හටගත් විට, වඩාත් විශාල විනිමය මුදු හැරීමක් ආනයන සම්බන්ධව සිදු විය. ආනයන ගෙවීම්, 1967 පැවති රුපියල් දශ ලක්ෂ 2,200 සිට, 1968 දී රුපියල් දශ ලක්ෂ 2,615 බවටත්, 1969 දී රුපියල් දශ ලක්ෂ 3,021 බවටත් සීඝ්‍රයෙන් ඉහළ නැගුණි. ඒ අතරම, ප්‍රාග්ධන ගෙවීම්, 1967 ට පසු තියුණු ලෙස ඉහළ යන උපනතියකින් යුක්ත විය. 1965 තෙක් වූ කාලයේ දී ප්‍රාග්ධන ගෙවීම්වල මුදුන් ප්‍රමාණය එකී වර්ෂයේ වූ රුපියල් දශ ලක්ෂ 121 විය. 1970 වන විට, ප්‍රාග්ධන ගෙවීම් රුපියල් දශ ලක්ෂ 656 ක් බවට ඉහළ නැගුණි.

### ගෙවුම් ශේෂය සහ සංවර්ධන උපක්‍රම

මෙම කොටසෙහි සාකච්ඡා කෙරී ඇති කරුණු, ලංකාවේ සංවර්ධන උපක්‍රමයන්හි ඇතැම් මූලික වෙනස්කම්වල අවශ්‍යතාවය පෙන්නුම් කරයි. පළමුවැන්න, අපනයන හා දේශීය සේවා නියුක්තිය ඉහළ නැංවීමට තුඩුදෙන ආයෝජන සඳහා විදේශීය ආධාර යොදු ගැනීම සම්බන්ධව වෙයි. ද්‍රව්‍ය ආධාර, නැත්නම් ආධාර නිසා වන ආනයන ඉතුරුම්, හැකිතාක් දුරට ගෙවුම් ශේෂයෙහි වහා වාසිදයක ප්‍රතිඵලයක් ඇති කරවනු ලබන යෝජනා ක්‍රම සඳහා ගලා යැවිය යුතුය. කෙටි කාලයක් තුළදී උපරිම වශයෙන් විදේශීය විනිමය ඉතුරුමක් ඇතිකළ හැකි බැවින්, විශේෂයෙන් අතිරේක භෝග ඇතුළු ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා දැඩි අවධානයක් යොමු කිරීමේ අවශ්‍යතාවය ද එයින් පෙන්වා දෙනු ලැබේ. ඛනිජ ද්‍රව්‍ය හා ස්වභාවික සම්පත් පිළිබඳ නිසියාකාර සංවිධානය වූ සමීක්ෂණයකින්, දැනට ආනයන කරනු ලබන අමු ද්‍රව්‍ය මත රැඳී සිටින දේශීය ඇතැම් කර්මාන්ත සඳහා යෙදවුම් වශයෙන් හෝ, අපනයන සඳහා හෝ යෙදවිය හැකි වෙනත් නිෂ්පාදිත හා අමු ද්‍රව්‍ය සඳහා ඇතැම් තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි වනු ඇත.

විදේශයන්ගෙන් ණය ලබාගත හැකිවීම එක්තරා අන්දමක අහිතකර ප්‍රතිඵල සහිත විය. එසේ නොවූයේ නම්, ගෙවුම් ශේෂයෙන් මතුවන දුෂ්කරතාවනට අනුරූපව ගතයුතු වන වියදම්හි දැඩි පිරිමැසුම් ක්‍රියා මාර්ගයන් නොගැන්මෙහිලා ලංකා ආර්ථිකය කිසියම් දුරකට ආවරණය කර ඇත. රටෙහි ගෙවුම් ශේෂයේ බැරෑරුම්කම සහ රාජ්‍ය හා පෞද්ගලික දෙ අංශයෙහිම සීඝ්‍ර වන් පැනවීමේ අවශ්‍යතාවය ආනයන නොනැවති සැපයුම මගින් යටපත් කර තිබේ. ගෙවුම් ශේෂ ගැටළුවලට මුහුණ දීමට නම්, මූලික අත්‍යාවශ්‍ය ද්‍රව්‍යයන් ද ඇතුළුව, සමස්ථ පරිභෝජන මට්ටමේ අඩු කිරීමක් අවශ්‍යය. පරිභෝජනයට වඩා ඉහල ආයෝජන මට්ටමක් දෙසට ප්‍රතිපත්ති අවධානයන් වේගයෙන් යොමු කළ යුතුය.

ප්‍රධාන වශයෙන් රජයේ අයවැයෙහි විශාලවූත්, වර්ධනය වන්නාවූත් හිඟයන්ට ප්‍රසාරණාත්මක මාර්ගයන් මුදල් සැපයීම නිසා, පෞද්ගලික අංශයට දෙනු ලබන ණය පාලනයන් පැවතියත්, ආනයන සඳහා ඉහළ හා වැඩෙන ඉල්ලුමක් ලංකාවේ දක්නට ලැබිණ. මෑත වර්ෂවල අයවැයෙහි වාර්ෂික ප්‍රසාරණාත්මක පරතරය රුපියල් දශ ලක්ෂ 400 ඉක්මවිය. ගෙවුම් ශේෂය කෙරෙහි තියුණු බලපෑමක් රහිතව, එබඳු ප්‍රසාරණාත්මක පරතරයක් පවත්වා ගැනීමට නුපුළුවන. එකී තියුණු බලපෑම් දරා සිටීමට, රටෙහි සංචිතයන් හා විදේශීයන්ගෙන් ණය ගැනීමේ ශක්තියට තවදුරටත් හැකි නොවනු ඇත. එබැවින් රජයේ අයවැය සැළකිය යුතු තුලනයකට ගෙන ඒම හා ප්‍රාග්ධන වියදමෙන් කොටසකට මුදල් සැපයීම සඳහා ජංගම ගිණුමේ සැළකිය යුතු අතිරික්තයක් ඇති කිරීම ගෙවුම් ශේෂ ප්‍රගතියට මූලික පිළියමක් වෙයි. 1970/71 අයවැය, රුපියල් දශ ලක්ෂ 97 ක ආගණිත මට්ටමෙහි ප්‍රසාරණාත්මක පරතරය පවත්වා ගනු ලැබුවේ නම්, එය ගෙවුම් ශේෂයට විශාල සහායක් වනු ඇත.

විදේශීය විනිමය ඉතුරුම් ජනිත කිරීමෙහිලා ආනයන ආදේශන ප්‍රතිපත්තිය කෙරෙහි විශාල ලෙස විශ්වාසය තබා තිබේ. කෙසේ වෙතත්, මෙම බලාපොරොත්තුව, මේ වනතෙක් සාධනය වී නොමැත. කාර්මික නිෂ්පාදිත සම්බන්ධයෙන්, තවදුරටත් ආනයන අමු ද්‍රව්‍ය මත විශාල ලෙස රැඳී සිටීමට ලංකාවට සිදුව ඇත. නව කර්මාන්ත සඳහා විදේශීය විනිමය වෙන් කිරීම සීඝ්‍රයෙන් ඉහළ යන අතර, වර්තමානයේ එය වර්ෂයකට දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 500 ක මට්ටමෙහි පවතී. ලංකාවේ නිමි භාණ්ඩ නිෂ්පාදනය සඳහා ආනයන කරනු ලබන අමු ද්‍රව්‍ය සියයට 75 ක තරම් ඉහළ අනුපාතයක් බව II (ආ) 6 සංඛ්‍යා සටහනෙන් අනාවරණය වෙයි. විශේෂ හිමිකම්, වෘත්තීය සේවා සම්බන්ධ ගාස්තු, විදේශීය කොටස් තබා ගැනුම් වෙනුවෙන් වන ලාභාංශ ආදිය සැළකිල්ලට ලක් කරන කල, ඇතැම් කර්මාන්ත, ගෙවුම් ශේෂය කෙරෙහි සෘණාත්මක බලපෑමක් දක්වයි. මෙම නව කර්මාන්ත සීමා කිරීමටත්, ඒවා ආනයන කළයුතුවන අමු ද්‍රව්‍යයන් මත රඳා පැවැත්ම සීඝ්‍රයෙන් අඩු කිරීමටත්, සඵල ක්‍රියා මාර්ග ගැනීම ඉතාමත් අවශ්‍යතම වෙයි. රටෙහි විදේශීය විනිමය ඉපයුම්වලින් හතරෙන් පංගුවක්, ද. ජා. නි. ට සියයට 10 ක් පමණ එකතුවක් කරනු ලබන, ඉතා සුළු වශයෙන් නැත්නම්, කිසිත් විදේශ විනිමයක් නො ඉපයෙන්නාවූත්, ඉතා සුළු ඉතුරුමක් ඇත්තාවූත් අංශයකට යෙදවීමේ ඇත්තේ සුළු සමාජ සාධාරණත්වයක් පමණි.

කෘෂිකර්මය සැළකිල්ලට ගත් විට, ආනයන ආදේශනය ඇත්තෙන්ම ගෙවුම් ශේෂය කෙරෙහි ඉතාම වාසිදයක බලපෑමක් ඇති කළේය. කෙසේ වුවත් කෘෂිකාර්මික අංශයෙහි මෙතෙක් ලබා ඇති දියුණුව ජනගහන වර්ධන අනුපාතිකයට සාපේක්ෂව එතරම් ප්‍රමාණවත් එකක් නොවේ. ඒ නිසා කෘෂිකාර්මික භාණ්ඩ ආනයනයන් සැලෙන අන්දමකින් අඩුකරලීමට තවමත් නොහැකිව පවතියි. 1970 වුවද, ආහාර සහ පාන වර්ග ආනයනයන් රුපියල් දශ ලක්ෂ 1,051 ක් හෙවත් මුළු ආනයනයන්ගෙන් සියයට 46 ක් විය. (රේඛ සංඛ්‍යා).

පරිභෝජනය සඳහා වූ ආනයනයන්, මුළු ආනයන වටිනාකමින් විශාල ප්‍රමාණයකි. 1970 දී මුළු ආනයනයන්ගෙන් සියයට 56 ක් පරිභෝජන ආනයනයන් විය. 1969 දී එහි ප්‍රමාණය සියයට 48 ක් විය. පරිභෝජනයෙහි මෙබඳු වැඩිවන ප්‍රවණතාවක් දැකිය හැක්කේ ජනගහනය වැඩිවීම හේතුවෙන් මුළු රටෙහිම පරිභෝජනය වැඩිවීම නිසා පමණක් නොව ඒක පුද්ගල ආදායම් තත්ත්වයන් වැඩිවීමත් හේතුවෙනි. ආයෝජන වියදම් තුළින් පරිභෝජනයෙහි ඇතිවන ක්‍රමික වැඩිවීමක්, සමස්ත වශයෙන් ආර්ථික වර්ධන අනුපාතිකය කෙරෙහිත්, ඉහළ සේවා නියුක්ති මට්ටමක් පවත්වා ගැනීම සඳහා අර්ථ ක්‍රමයෙහි ධාරිතාව කෙරෙහිත් අහිතකර බලපෑම් ඇති කෙරෙයි. මෙවැනි තත්ත්වයකදී සතුටුදායක වර්ධන

අනුපාතිකයක් පවත්වා ගැනීමට උපකාරි වන සෑහෙන තරමේ ඉහළ ආයෝජන මට්ටමක් අර්ථ ක්‍රමයට පවත්වා ගත හැකි සීමාවන් තුළ පරිභෝජන මට්ටම ගෙන යාමට රජය මුල් තැනක් දීම අත්‍යාවශ්‍යය. මෙහිදී පරිභෝජනය හා පිහිටාධාර සඳහා කෙරෙන වියදම් සහ රජයේ ව්‍යවසායන් මගින් සපයන පොදු සේවාවන් සඳහා වූ යථාර්ථික මිලත් සම්බන්ධයෙන් ඉක්මනින්ම සමාලෝචනයක් කළ යුතු වෙයි.

අපනයන ඉපැයුම් වැඩි කර ගැනීම හෝ විදේශ ආධාර වැඩියෙන් ලබා ගැනීම හෝ විශාල ආනයන ආදේශනයක් - විශේෂයෙන් කෘෂිකර්මය සම්බන්ධයෙන් ඇතිකර ලීම, ආනයන අඩුකර ගැනීම වෙනුවට ගත හැකි විකල්ප මාර්ගයන්ය. සම්ප්‍රදායික අපනයනයන් මගින් අපනයන ඉපැයුම් වැඩි කර ගැනීම සලකා බලන විට මේ සම්බන්ධයෙන් පවතින වෙළඳ පොළ උපනතීන් පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ මෙම නිෂ්පාදිතයන් මගින් මෑත අනාගතයේදී සැලකිය යුතු ආදායමක් එතරම් බලාපොරොත්තු විය නොහැකි බවයි. පොල් නිෂ්පාදිතය සම්බන්ධයෙන් සලකා බලන විට, එහි තවත් විශේෂ ප්‍රශ්නයක් වෙයි. එනම් දේශීය පරිභෝජනය හේතු කොට ගෙන අපනයනය සඳහා පවතින ප්‍රමාණයන් කෙරෙහි විශාල වශයෙන් බලපෑමක් ඇතිවීමයි. දේශීය පරිභොජනයෙහි වැඩිවන වේගයට වඩා, නිෂ්පාදන වේගය වැඩි නොවුව හොත් එම ප්‍රශ්නය තවදුරටත් නොවිසඳී තිබිය හැක. ප්‍රධාන ආනයන නිෂ්පාදිතයන් සම්බන්ධයෙන් එවැනි අස්ථායි තත්ත්වයන් නිසා අපනයන පරිශ්‍රමයන් අවශ්‍යයෙන්ම, නව නිෂ්පාදිතයන් සංවර්ධනය කිරීමෙහිලා යොමු කරවිය යුතුයි.

මෙම අංශයෙහි සැලකිය යුතු තරමේ ප්‍රගතියක් දැනටමත් ලබා ඇති නමුත්, තේ, රබර් හෝ පොල් තනි තනිව ගත් විට එමගින් කෙරෙන දයකත්වයේ ප්‍රමාණය තරම් වෙනත් නව අපනයන නිෂ්පාදිතයක් හෝ නිෂ්පාදිත සමූහයක් හෝ තවම වර්ධනය වී නැත. අතිරේක වශයෙන්, සැලකිය යුතු ප්‍රමාණයක විදේශ විනිමය ඉපදවිය හැකි භාණ්ඩ වර්ග කීපයක් සම්බන්ධ අපනයන වෙළඳාම වැඩිදියුණු කර ගැනීම අතිශයින්ම ප්‍රයෝජනවත් වේ.

විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය යටතේ අනුබලදීම තිබුනේ වුවද, මෑත කාලයේදී මැණික් වලින් ලැබුණු අපනයන ආදායම් සම්පූර්ණයෙන්ම පාහේ සැලකිය යුතු නොවන තරමය. මෙය, රටට විශාල සම්පත් ලබාදීමේ සමත් අපනයන භාණ්ඩයකි. සංචාරක ව්‍යාපාරය දිරිගැන්වීමෙහිලා දැනට ගනු ලබන විශේෂ පරිශ්‍රමයන් හා යෝජිත මැණික් සංස්ථාවත්, විදේශ විනිමය ඉපයීම්හි සැලකිය යුතු වැඩිවීමක් ඇති කරලීමට සමත් විය හැක.

අනිත් විකල්ප මාර්ගය වැඩියෙන් ආධාර ලබා ගැනීමයි. විදේශාධාර හුදු පරිත්‍යාග වලින් යුක්තවේ නම් එහි ප්‍රශ්නයක් නැත එහෙත්, එවැනි පරිත්‍යාග ප්‍රමාණය කුඩා බවත්, විදේශාධාර පොලියත් සමග ආපසු ගෙවිය යුතු ණය දීමනාවලින් යුක්ත වන බවත් 1-8 වැනි සංඛ්‍යා සටහනින් පෙනේ. ගෙවුම් ශේෂ තත්ත්වය අනුව බලන විට, තවදුරටත් කෙටිකාලීන ආධාර විශාල වශයෙන් ප්‍රයෝජනයට ගැනීම එතරම් සුදුසු නොවේ. දැනට ලංකාව මුහුණ පා ඇති ගෙවුම් ශේෂ ප්‍රශ්නය තාවකාලික හෝ චක්‍රීය එකක් නොව, මතු දැකිය හැකි අනාගතයේදී ආපසු වෙනස් නොවන, විෂමතාවයන්ගේ ප්‍රතිඵලයක් නිසා එය ස්වභාවයෙන්ම ව්‍යුහමය වශයෙන් උරුම වූ දෙයකි.

ලංකාවේ ගෙවුම් ශේෂයෙහි මූලික අසමතුලිතතාව, ප්‍රධාන වශයෙන්ම පවත්නා සම්පත්වලට වඩා වැඩි වියදමෙහි ප්‍රතිඵලයකි. මෙම ප්‍රශ්නයට විසඳුමක් ක්‍රියාවෙහි යෙදවීමට වඩා ඉදිරිපත් කිරීම පහසුය. මෙයට මූලික විසඳුම අඩුවෙන් වියදම් කිරීමයි. නොඑසේනම් වැඩියෙන් ඉතිරි කිරීමයි. ලංකාවේ පවත්නා ඉතුරුම් අනුපාතිකය, පවත්නා ශ්‍රම බලය උරා ගැනීමට ශක්තියක් ඇති සංවර්ධන සැලසුමක් ගෙනයාමට තරම් ප්‍රමාණවත් නොවේ. මෙම ප්‍රශ්නයට විසඳුමක් සෙවීමේදී අධිකතර වියදම් කපා හැරීමට සිදුවනු ඇත. එවැනි කපා හැරීමක්, පවත්නා පරිභෝජනය සම්බන්ධයෙන් මිස නිෂ්පාදන ආයෝජනයන් මත නොවිය යුතුය. ඉහළ ආයෝජන අනුපාතිකයක් සේවා වියුක්ති ප්‍රශ්නයට නියම විසඳුම පමණක් නොව ඒ අනුව උත්පාදනය වන භාණ්ඩ හා සේවාවන් අද පවත්නා අනිකුත් ප්‍රශ්නයන්ටද, එනම් ඉහළ ජීවන වියදම සහ ගෙවුම් ශේෂයෙහි අසමතුලිතතාව වැනි ප්‍රශ්නයන්ටද අවසාන පිළිතුරක් සපයාලයි.

පවත්නා හැම විසඳුම් මාර්ගයකම ඊටම ආවේනිකවූ ප්‍රශ්නයක් සහ සීමාවන් පවතින නිසා අංශ කීපයකින්ම එකම අවස්ථාවේදී නොයෙකුත් ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීමට සිදුවෙයි. මෙසේ ගෙවුම් ශේෂය ශක්තිමත් පදනමක තබා ගැනීමට නම් සෑහෙන දිගු කාලයක් තුළ එක්වන් ජාතික පරිශ්‍රමයක් පවත්වා ගැනීම අවශ්‍ය වෙයි.